*සියළුම හිමිකම් ඇවිරිණි.*

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්**
**සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ මාලාව**
**පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II** | **පැය තුනයි**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**සැලකිය යුතුයි:-**

(i) **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පෞද්ගලික ප්‍රවාහන අවශ්‍යතා සපුරාලන ප්‍රසිද්ධ ආයතනයක් වන “දිලා ට්‍රැවල්ස් ”ආයතනයේ වසර කිහිපයක් සේවය කළ සනුකි ඉන් ඉවත්ව “සනු ට්‍රැවල්ස් ”නමින් පෞද්ගලික ප්‍රවාහන සේවා සපයන ආයතනයක් ආරම්භ කළාය.අධිවේගී මාර්ග ඉදිවීම , මාර්ග පුළුල්වීම තම ව්‍යාපාර කටයුතු වලට පහසුවක් බවත් සෑම වර්ෂයකම මුල් මාස වලදී පාසල් අධ්‍යාපන චාරිකා වෙනුවෙන් බස්රථ සඳහා විශාල ඉල්ලුමක් පවතින බවද ඇය ප්‍රකාශ කළාය.

1. සිද්ධියේ සඳහන් “සනු ට්‍රැවල්ස් ” ආයතනය විසින් සපුරාලන අවශ්‍යතාවක් සහ වුවමනාවක් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) විනෝදය- චාරිකා　　(2) සෞඛ්‍ය- විනෝදය
(3) ප්‍රවාහනය-චාරිකා　　(4) චාරිකා -ප්‍රවාහනය

2. “සනු ට්‍රැවල්ස් ”ආයතනයට ඇල්මක් දක්වන සිද්ධියේ සඳහන් පාර්ශ්වයන් දෙකක් වන්නේ ;

(1) “දිලා ට්‍රැවල්ස් ” හා පාසල් සිසුන්
(2) ණයදෙන ආයතන හා ප්‍රජාව
(3) සේවකයින් හා බැංකු
(4) බැංකු හා රජය

3. සනුකිගේ ව්‍යාපාරය සතු ශක්තියක් හා අවස්ථාවක් පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) සනුකි දිලා ට්‍රැවල්ස් ආයතනයේ සේවය කර තිබීම හා අධිවේගී මාර්ග ඉදිවීම.
(2) මහාමාර්ග පුළුල්වීම හා බස්රථ සඳහා ඇති ඉල්ලුම.
(3) සනුකිට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම හා ඇය සතු ව්‍යාපාරික හැකියාව.
(4) පාසල් අධ්‍යාපන චාරිකා සහ සනුකිගේ කැපවීම.

4. සනු ට්‍රැවල්ස් ආයතනය සතු වාහන අයත්වන නිෂ්පාදන සාධක වන්නේ;

(1) භූමිය　　(2) ප්‍රාග්ධනය
(3) ශ්‍රමය　　(4) ව්‍යවසායකත්වය

5. පහත දැක්වෙන ව්‍යාපාර සංවිධාන වර්ග අතුරෙන් ලාභ අරමුණු කරගත් ව්‍යාපාර සංවිධාන වර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A. සංස්ථාපිත සමාගම්　B. රාජ්‍ය සංස්ථා　C. තනිපුද්ගල ව්‍යාපාර
D. හවුල් ව්‍යාපාර　E. රාජ්‍ය දෙපාර්තමේන්තු

(1) A,D,E　　(2) A,B,C
(3) A,C,D　　(4) B,C,E

6. හවුල් ව්‍යාපාරයක සිටිය යුතු උපරිම සාමාජික සංඛ්‍යාව තීරණය කිරීමට අදාළ පනත වන්නේ,

(1) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතය
(2) 2007 අංක 7 දරණ සමාගම් පනතය
(3) වංචා වැලැක්වීමේ ආඥා පනතය
(4) 1972 අංක 5 දරණ සමූපකාර සමිති පනතය

7. "විමල ස්ටෝර්ස්" ව්‍යාපාරයේ නාමය ලියාපදිංචිය අනිවාර්ය බව එහි අයිතිකරු වන නුවන් විමලසිරිට උපදෙස් ලැබී ඇත.එයට හේතුව වන්නේ;

(1) ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ලබාගැනීම අනිවාර්ය නිසාය.
(2) රජයෙන් සහන ලබා ගැනීමට සුදුසුකමක් වන නිසාය.
(3) ඔහුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යන නිසාය.
(4) ඔහුගේ නමට සමාන නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යන නිසාය.

8. වාණිජ බැංකු විසින් පවත්වාගෙන යන ගිණුම් වර්ගයක ප්‍රයෝජන කිහිපයක් පහත දැක්වේ.

a) මුදල්වලට ආරක්ෂාවක් ලැබීම.
b) පොළී ආදායමක් ලැබීම.
c) හරපත් භාවිතයෙන් ගෙවීම් කටයුතු කළ හැකි වීම.

ඉහත ලක්ෂණ දැකිය හැකි ගිණුම් වර්ගය වනුයේ;

(1) ජංගම ගිණුමිය. (2) ස්ථාවර තැන්පතු ගිණුමිය.
(3) ඉතිරිකිරීමේ ගිණුමිය. (4) කාලීන තැන්පතු ගිණුමිය.

9. රුවන්වැල්ල ලංකා බැංකුවේ ජංගම ගිණුමක් හිමි අසංග, අවිස්සාවේල්ල සෙලාන් බැංකුවේ ජංගම ගිණුමක් පවත්වාගෙන යන සිවනාදන්ගෙන් තම ව්‍යාපාරයට අවශ්‍ය යන්ත්‍රයක් මිලදී ගත් අතර ඒ සඳහා චෙක්පතකින් මුදල් ගෙවා ඇත.

ඉහත සිද්ධියට අදාල චෙක්පතේ අණකරු , අණලදු සහ ආදායකයා අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) අසංග, ලංකා බැංකුව - රුවන්වැල්ල, සිවනාදන්
(2) සිවනාදන්, සෙලාන් බැංකුව - අවිස්සාවේල්ල, අසංග
(3) අසංග, සෙලාන් බැංකුව - අවිස්සාවේල්ල, සිවනාදන්
(4) සිවනාදන්,ලංකා බැංකුව - රුවන්වැල්ල, අසංග

10. ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ජීවිත රක්ෂණය සඳහා උපරිම විශ්වාසය මූලධර්මය අදාළ නොවේ.
(2) ජීවිත රක්‍ෂණ ඔප්පුවක වටිනාකම අදාළ රක්‍ෂිතයා තීරණය කරයි.
(3) ජීවිත රක්ෂණය සඳහා හානි පූර්ණය මූලධර්මය අදාළ වේ.
(4) ජීවිත රක්‍ෂණ ඔප්පුවක් ලබා ගත්විට එම ජීවිතයට ඇති සියලු අවදානම් නැති වේ.

11. සන්නිවේදන ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A. ස්කයිප් B.චක්‍රලේඛ
C. විද්‍යුත් තැපැල D. ඩිජිටල් පුවරු

ඉහත ක්‍රම අතුරින් විද්‍යුත්, වාචික හා ලිඛිත යන මාධ්‍ය තුනටම අයත් වන්නේ;

(1) A පමණි. (2) A හා Bපමණි.
(3) B හා C පමණි. (4) ඉහත සියල්ලම වේ.

12. කිසියම් ප්‍රවාහන මාධ්‍යයක ඇති වාසි හා අවාසි කිහිපයක් පහත දැක්වේ.

A.මගීන් හා භාණ්ඩ විශාල ප්‍රමාණයක් එකවර ගෙන යා හැකි ය
B.මාර්ග තදබදයක් ඇති නොවීම.
C. සාපේක්ෂව අඩු කාලයක් ගතවීම.
D.ගමනාන්තයට යා නොහැකිය.

ඉහත දැක්වෙන විස්තරවලට අනුව වඩාත්ම ගැලපෙන ප්‍රවාහන මාධ්‍යය වන්නේ;

(1) ගුවන් මාර්ග ප්‍රවාහනයේ ය. (2) ජල මාර්ග ප්‍රවාහනයේ ය.
(3) මහා මාර්ග ප්‍රවාහනයේ ය. (4) දුම්රිය මාර්ග ප්‍රවාහනයේ ය.

13. රටවල් දෙකක් හෝ කිහිපයක් අතර සිදුවන වෙළෙඳාම.........(1)............ වෙළෙඳාම වන අතර ශ්‍රී ලාංකික රබර් නිෂ්පාදිත විදේශ රටවලට විකිණීම ............(2)............... වෙළෙඳාම යි.

පිළිවෙලින් ඉහත අංක (1) හා (2) යන හිස්තැන්වලට ගැළපෙන පිළිතුර තෝරන්න.

(1) විදේශීය හා ආනයන (2) ආනයන හා අපනයන
(3) විදේශීය හා අපනයන. (4) අපනයන හා ආනයන.

- පහත සිද්ධිය ඇසුරෙන් අංක 14 සහ 15 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- යෝගට් නිෂ්පාදන ආයතනයක් තම ආයතනයේ අපේක්ෂිත අලෙවිය පහත වැටීමට හේතු සොයා බැලීමෙන් අනතුරුව නව ඇසුරුමකින් යෝගට් වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

14. යෝගට් අලෙවිය පහත වැටීමට හේතු සොයා බලා අවශ්‍ය ප්‍රතිකර්ම යෙදීම කළමනාකරණයේ කුමන කාර්යයට අයත්ද?

(1) මෙහෙයවීම (2) සංවිධානකරණය
(3) පාලනය (4) සැලසුම්කරණය

15. ඉහත ව්‍යාපාරය යොදාගෙන ඇති අළෙවි මිශ්‍රයේ විචල්‍ය වනුයේ ;

(1) මිල (2) ප්‍රවර්ධනය
(3) නිෂ්පාදිතය (4) ස්ථානය

16. පුද්ගලයකුට තම මුදල් ආයෝජනය තුලින් ප්‍රාග්ධන ලාභ ඉපයීමේ හැකියාව ඇත්තේ;

(1) භාණ්ඩාගාර බිල්පත්වලිනි. (2)ඉතිරිකිරීමේ තැන්පතු වලිනි.
(3) ස්ථාවර තැන්පතු වලිනි. (4)සමාගමක සාමාන්‍ය කොටස් මිලදී ගැනීමෙනි.

- ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ. ඒ ඇසුරෙන් ප්‍රශ්න අංක 17 හා 18 සඳහා පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| A - අයිතිකරු අමතර ප්‍රාග්ධනය යෙදීම | රු. 500 000 |
| B - අත්පිට මුදලට භාණ්ඩ ගැනීම | රු. 20 000 |
| C - විදුලි ගාස්තු ගෙවීම | රු. 8 000 |

D - රු.8 000ක භාණ්ඩ තොගයක් රු. 10 000කට විකිණීම.

17. ඉහත A,B,C,D ගනුදෙනු අවසානයේ වත්කම්වල වටිනාකමේ සිදුවූ වෙනස කීයද?

(1) රු.494 000 (2) රු.510 000
(3) රු.526 000 (4) රු.530 000

18. ඉහත ගනුදෙනු අතරින් හිමිකම වෙනස්වීමට බලපාන ගනුදෙනු වන්නේ;

(1) A,B හා C (2) A,C හා D
(3) B,C හා D (4) A,B,C හා D යන සියල්ල

19. ව්‍යාපාරයකට රු.2 000 000 ක් ගෙවා යන්ත්‍රයක් මිලදී ගැනීම නිසා,

(1) වත්කම් වැඩි වේ, වගකීම් වැඩිවේ. (2) වියදම් වැඩිවේ, වත්කම් වැඩි වේ.
(3) හිමිකම් වැඩි වේ, වත්කම් අඩු වේ. (4) වත්කම් වැඩි වේ, වත්කම් අඩු වේ.

20. X තීරුවේ ගිණුම් වර්ග ද Y තීරුවේ එම ගිණුම් සඳහා නිදසුන් කිහිපයක් ද පහත දැක්වේ.

| X | Y |
|---|---|
| 1. හිමිකම් | A. බැංකු ණය පොලී ගිණුම |
| 2. වගකීම් | B. උපචිත වියදම් ගිණුම |
| 3. ආදායම් | C. ගැනිලි ගිණුම |
| 4. වියදම් | D. විකුණුම් ගිණුම |

X තීරුවේ සඳහන් ගිණුම් වර්ග Y තිරුවේ සඳහන් නිදසුන් සමඟ පිළිවෙලින් ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ;

(1) 1-C,2-A,3-B,4-D (2) 1-C,2-B,3-D,4-A
(3) 1-A,2-B,3-C,4-D (4) 1-A,2-D,3-C,4-B

21. ව්‍යාපාරයක මූලික පොත්වල සටහන් කර තිබූ ගනුදෙනු දෙකක් පහත දැක්වේ.

අත්පිට විකුණුම් රු.15 000
ණය හිමියකුට ගෙවීම රු.14 000

ඉහත ගනුදෙනු මූලික සටහන් පොත්වල සටහන් කිරීමේ දී භාවිත කළ මූලාශ්‍ර ලේඛන පිළිවෙලින්;

(1) විකුණුම් ඉන්වොයිසිය, ගැනුම් ඉන්වොයිසිය (2) ලදුපත , ගැනුම් ඉන්වොයිසිය
(3) ලදුපත , ගෙවීම් වවුචරය (4) ගෙවීම් වවුචරය, ජ'නල් වවුචරය

- බැංකු ජංගම ගිණුමක් පවත්වාගෙන යන සඳුනිට රු.15 000 දක්වා අයිරා පහසුකම් ලබා ගැනීමට අවසර ඇත.ඇයගේ බැංකු ගිණුමේ ශේෂය රු.6 000ක් ව තිබිය දී ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්‍ෂණ ගාස්තු රු.10 000කි.

ප්‍රශ්න අංක 22 හා 23 ට ඉහත සිද්ධිය අදාළ වේ.

22. සඳුනි ලබා ගෙන ඇති බැංකු අයිරාවේ වටිනාකම වනුයේ
(1) රු.15 000 (2)රු.10 000 (3)රු.6 000 (4)රු.4 000

23. ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්‍ෂණ ගාස්තු සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන

| | | | |
|---|---|---|---|
| (1) බැංකු ගිණුම | හර | රු.10 000 | |
| රක්‍ෂණ ගාස්තු ගිණුම | බැර | | රු. 10 000 |
| (2)රක්‍ෂණ ගාස්තු ගිණුම | හර | රු.6 000 | |
| බැංකු ගිණුම | බැර | | රු. 6 000 |
| (3) රක්‍ෂණ ගාස්තු ගිණුම | හර | රු.4 000 | |
| මුදල්ගිණුම | බැර | | රු.4 000 |
| (4) රක්‍ෂණ ගාස්තු ගිණුම | හර | රු.10 000 | |
| බැංකු ගිණුම | බැර | | රු.10 000 |

24. මුදල් පොතේ හර පැත්තේ වට්ටම් තීරුවේ එකතුව දුන් වට්ටම් ගිණුමේ සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන් රීතිය වන්නේ;

(1) ආදායම් - වැඩිවීම - හර (2) වියදම් - වැඩිවීම - හර
(3) ආදායම් - වැඩිවීම - බැර (4) වියදම් - වැඩිවීම - බැර

25. ව්‍යාපාරයක පැවති සුළු මුදල් අග්‍රිමය රු.2 500කි. 2018.03.31දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු.500ක් වූ අතර එදින ප්‍රතිපූර්ණය කළ මුදල රු.3 000කි. මාර්තු මාසයේ සිට සුළු මුදල් අග්‍රිමය කොපමණ මුදලකින් වැඩි කර තිබේ ද?

(1) රු.500 කි. (2) රු.1 000 කි. (3) රු.2 000 කි. (4) රු.2500 කි.

26. විකුණුම් ජර්නලය;

(1) මූලාශ්‍ර ලේඛනයකි.
(2) ලෙජර් ගිණුමකි.
(3) මූලික සටහන් පොතකි.
(4) විකුණුම් ගිණුමකි.

27. පහත සඳහන් තොරතුරු ඔබට ලබා දී ඇත.

A. රු.10 000ක් වටිනා භාණ්ඩ තොගයක් ණයට විකිණීම
B.රු.20 000ක් වටිනා යන්ත්‍රයක් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා සේපාලගෙන් ණයට ගැනීම.
C.රු.6 000ක් වටිනා භාණ්ඩ තොගයක් ණයට ලබා ගැනීම
D.අයිතිකරු රු.5 000ක් වටිනා භාණ්ඩ තොගයක් පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන යාම.

ඉහත සඳහන් ගනුදෙනු අයිතමයන් අතරින් පොදු ජ'නලයේ වාර්තා කරන ගනුදෙනු වන්නේ;

(1) A,D (2) A,C,D, (3) B,C (4) B,D

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 28 හා 29 ට පිළිතුරු සපයන්න.

ණය හිමියෙකුගෙන් ලද වට්ටම රු.1 500 කි. මෙය ලද වට්ටම් ගිණුමට හා ණය හිමි ගිණුමට ද හර කර ඇත.

28. මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ;

(1) ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම අංක ගණිතමය සමානතාවයට බල නොපායි.
(2) අවිනිශ්චිත ගිණුමේ රු.3 000ක බැර ශේෂයක් පවතී.
(3) අවිනිශ්චිත ගිණුමේ රු.1 500ක හර ශේෂයක් පවතී.
(4) ලද වට්ටම් ගිණුම නිවැරදි ව සටහන් කර ඇත.

29. ඉහත වරද නිවැරදි කිරීමේ ද්විත්ව සටහන වන්නේ;

| | | |
|---|---|---|
| (1) ණයගැති ගිණුම හර | රු.1 500 | |
| ලද වට්ටම් ගිණුම බැර | | රු. 1 500 |
| (2) අවිනිශ්චිත ගිණුම හර | රු.1 500 | |
| ලද වට්ටම් ගිණුම බැර | | රු. 1 500 |
| (3) අවිනිශ්චිත ගිණුම හර | රු.3 000 | |
| ලද වට්ටම් ගිණුම බැර | | රු. 3 000 |
| (4) ණයහිමි ගිණුම හර | රු.1 500 | |
| ලද වට්ටම් ගිණුම බැර | | රු. 1 500 |

- පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 30 හා 31 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
සඳලි මල් පෝච්චි නිෂ්පාදනය සඳහා ව්‍යාපාරයක් ආරම්භ කළ අතර 2018 ජනවාරි මාසයට අදාළ තොරතුරු පහත දැක්වේ.
  - සෘජු ද්‍රව්‍ය පිරිවැය රු.80 000
  - සෘජු වෙනත් වියදම් රු.20 000
  - වක්‍ර වියදම් රු.30 000

ජනවාරි මාසය තුළ දී මල් පෝච්චි 2 000ක් නිෂ්පාදනය කරන ලදී. නිෂ්පාදනය කරන එක් මල් පෝච්චියක් සඳහා රු.35 ක මුදලක් සේවක වැටුප් සඳහා ද ගෙවන ලදී.

30. ප්‍රාථමික පිරිවැය වන්නේ;

(1) රු.100 000 කි. (2)රු.130 000 කි. (3)රු.170 000 කි. (4)රු.200 000 කි.

31. මල් පෝච්චි එකක නිෂ්පාදන පිරිවැය වන්නේ;

(1) රු.50 කි. (2) රු.65 කි. (3) රු.85 කි. (4) රු.100 කි.

32. සුපර් හීරෝ ක්‍රීඩා සමාජයේ මෙම වසර තුළ පහත ගනුදෙනු සිදු වී ඇත.

| | | |
|---|---|---|
| A. | ක්‍රීඩා උපකරණ මිලට ගැනීම් | රු. 50 000 |
| B. | මුදලින් ලද පරිත්‍යාග | රු. 100 000 |
| C. | පරණ පත්තර විකුණුම් | රු. 50 000 |
| D. | සාමාජික ගාස්තු ලැබීම් | රු. 10 000 |

ඉහත අයිතමයන්ගෙන් ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම සඳහා භාවිතයට ගන්නා අයිතම ඇතුළත් කාණ්ඩය වන්නේ;

(1) A,B,C,D (2) B,C පමණි (3) B හා D පමණි (4) B,C හා D පමණි

33. සුපර් හීරෝ ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 150කි. වාර්ෂික සාමාජික ගාස්තුව රු.100කි. සාමාජිකයින් 15 දෙනකු හැර සියළු දෙනා මෙම වසරේ සාමාජික මුදල් ගෙවා තිබුණි. මෙම වසරේ සාමාජික මුදල් ලැබීම වන්නේ;

(1) රු.15 000 කි. (2) රු.13 500 කි. (3) රු.1 500 කි. (4) රු.1 350 කි.

34. ප්‍රසංග ව්‍යාපාරයේ 2017.01.01 ට මෝටර් රථ පිරිවැයට රු. 100 000, 2017.01.01 ට සමුච්චිත ක්ෂය රු.20 000කි.මෙම මෝටර් රථයේ වාර්ෂික ක්ෂය ප්‍රතිශතය 10% කි. 2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පෙන්විය යුතු පිරිවැය හා ධාරණ අගය වන්නේ;

(1) රු.100 000 - රු.80 000 කි. (2) රු.100 000 - රු.90 000 කි.
(3) රු.100 000 - රු.70 000 කි. (4) රු.70 000 - රු.100 000කි.

35. ජයවර්ධන ස්ටෝර්ස් හි 2017 වසරේ මුළු විකුණුම් වටිනාකම රු.100 000කි. ඉන් 60%ක් ණයට විකුණුම් වේ. ණයට විකුණුම්වලින් 50%ක් මුදල් ව්‍යාපාරයට ලැබී තිබුණි. ඉතිරි ණය ගැතියන්ගෙන් 10%ක් බොල් ණය ලෙස කපා හරින ලදී. ණය ගැති ගිණුමේ ශේෂය සහ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දැක්වෙන බොල් ණය වන්නේ;

(1) රු.30 000 - රු.3 000 කි. (2) රු.6 000 - රු.6 000 කි.
(3) රු.27 000 - රු.3 000 කි. (4)රු.54 000 - රු.6 000කි.

- පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
  විහඟ රන්සර ව්‍යාපාරයේ ආධුනික ගිණුම් ලිපිකරුවකු විසින් 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ වෙළෙඳ හා ලාභා ලාභ ගිණුම පහත දැක්වේ.

වෙළෙඳ හා ලාභාලාභ ගිණුම

| | | | | | |
|---|---|---|---|---|---|
| ආරම්භක තොගය | | 10 000 | විකුණුම් | | 63 000 |
| (+) ගැණුම් | 35 000 | | | | |
| (-) අවසාන තොගය | (3 000) | 32 000 | | | |
| විකුණුම් පිරිවැය | | 42 000 | | | |
| දළ ලාභය (ප/ගෙ) | | 21 000 | | | |
| | | 63 000 | | | 63 000 |
| | | | දළ ලාභය ඉ/ගෙ | | 21 000 |
| <u>බෙදා හැරීමේ වියදම</u> | | | (+) ලද වට්ටම් | 2 000 | |
| බොල් ණය | 500 | | ආයෝජන ආදායම් | 3 000 | 5 000 |
| වේතන | 1 500 | | | | |
| මෝටර් රථ ක්ෂය | 10 000 | | | | |
| පැටවුම් කුලී | 500 | | | | |
| ගෙනඒමේ කුලී | 800 | 13 300 | | | |
| <u>පරිපාලන වියදම්</u> | | | | | |
| අළුත්වැඩියා වියදම් | 800 | | | | |
| රක්ෂණ ගාස්තු | 500 | 1 300 | | | |
| <u>මූල්‍ය හා වෙනත්</u> | | | | | |
| බැංකු ණය පොලී | 500 | 500 | | | |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා | | 10 900 | | | |
| | | 26 000 | | | 26 000 |

36. විහඟ රන්සර ව්‍යාපාරයේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂයේ නිවැරදි විකුණුම් පිරිවැය වන්නේ;

(1) රු.42 000 කි. (2) රු.43 300 කි. (3) රු.42800 කි. (4) රු.42500 කි.

37. බෙදාහැරීමේ වියදම් සහ පරිපාලන වියදම්වල නිවැරදි අගයන් පිළිවෙලින් දැක්වෙන්නේ;

(1) රු.2 800 - රු.10 500 (2) රු.3 300 - රු. 10 500
(3) රු.10 500 - රු. 2 800 (4) රු.10500 - රු. 3 300

38. මෙම ව්‍යාපාරයේ නිවැරදි දළ ලාභය සහ වෙනත් ආදායම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ ;

(1) රු.21 000 - රු. 5 000 (2) රු.20 500 - රු.5 000
(3) රු.19 700 - රු. 5 000 (4) රු.20 200 - රු.5 000

39. මෙම ව්‍යාපාරයේ වර්ෂය තුළ ගෙවූ බැංකු ණය පොලිය රු.300ක් ද, ලද ආයෝජන ආදායම රු.1 800 ක් ද නම් උපචිත වියදම් හා උපචිත ආදායම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ ;

(1) රු.500 - රු.3 000 කි. (2) රු.300 - රු.1 200කි.
(3) රු.200 - රු.3 000කි. (4) රු.200 - රු.1 200කි

40. පිරිවැය රු.100 000 ක් වූ මෝටර් රථයේ 2017.01.01 දිනට සමුච්චිත ක්ෂය වටිනාකම රු. 10 000කි. 2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු ධාරණ අගය වන්නේ,

(1) රු.20 000 (2) රු.80 000
(3) රු.90 000 (4) රු.100 000

***

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්**
**සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ මාලාව**
**ව්‍යාපාර සහ ගිණුම්කරණ අධ්‍යයනය**
**පෙරහුරු ප්‍රශ්න පත්‍රයසඳහා පිළිතුරු**
**I පත්‍රය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 1. | 1 | 11. | 1 | 21. | 3 | 31. | 4 |
| 2. | 1 | 12. | 4 | 22. | 4 | 32. | 4 |
| 3. | 1 | 13. | 3 | 23. | 4 | 33. | 2 |
| 4. | 2 | 14. | 3 | 24. | 2 | 34. | 3 |
| 5. | 3 | 15. | 3 | 25. | 2 | 35. | 3 |
| 6. | 2 | 16. | 4 | 26. | 3 | 36. | 2 |
| 7. | 3 | 17. | 1 | 27. | 4 | 37. | 4 |
| 8. | 3 | 18. | 2 | 28. | 2 | 38. | 3 |
| 9 | 1 | 19. | 4 | 29. | 3 | 39. | 4 |
| 10. | 2 | 20. | 2 | 30. | 3 | 40. | 2 |

එක් නිවැරදි පිළිතුරකට ල.01 බැගින් මුළු ලකුණු 40x1 = 40

*සියළුම හිමිකම් ඇවිරිණි.*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
**සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ මාලාව**
**පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I , II**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

**වැදගත්:** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවලදී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව 1 කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද,II** කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද**, බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

* පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (X) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ආහාර පරීක්ෂකවරයකු ලෙස කලක් සේවය කළ අමරසේන රැකියාවෙන් ඉවත් වී ඔහු සතු රු.150 000ක මුදලක් යොදවමින් 2018.01.01 දින ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. **"ෆුඩ් සීක්‍රට්"** ලෙස නම් කර ඇති මෙම ව්‍යාපාරයේ මිරිස් කුඩු, තුනපහ කුඩු ඇතුළු ස්වභාවික කුළු බඩු ඇසුරෙන් සකස් කළ නිෂ්පාදිත අලෙවි කිරීම සිදු කරයි. **"ෆුඩ් සීක්‍රට්"** ව්‍යාපාරයට අවශ්‍ය නිෂ්පාදිත"ගෝල්ඩන් ස්පයිසි" කර්මාන්ත ආයතනයෙන් තොග වශයෙන් මිලදී ගන්නා අතර, ගොරකා පේස්ට් මිලදී ගනු ලබන්නේ අමරසේනගේ දියණිය වන තිළිණිගෙන්ය.

2018 ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනුවලට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| ලී බඩු උපකරණ මිලදී ගැනීම | රු. 20 000 |
| අත්පිට මුදලට ගැනුම් (ගොරකා පේස්ට් ද ඇතුළුව) | රු. 40 000 |
| ණයට ගැනුම් | රු. 20 000 |
| විදුලිය ගාස්තු | රු. 3 000 |
| ගොඩනැගිලි කුලී | රු. 15000 |
| විවිධ වියදම් | රු. 2 800 |
| අත්පිට විකුණුම් | රු.120 000 |

- 2018.01.31 දිනට ඉතිරි තොගයේ වටිනාකම රු.10 000කි.
- ලී බඩු උපකරණ වාර්ෂිකව 12% බැගින් ක්ෂය කළ යුතුය.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ "කුළු බඩු සැකසීමේ තාක්ෂණය" පාඨමාලාව හදාරන අමරසේනගේ දියණිය තිළිණි අධ්‍යාපන කටයුතුවලට අදාළ ව්‍යාපෘතිය සඳහා ගොරකා පේස්ට් සකස් කර 100g බඳුන් (පොලිකප්) වශයෙන් **"ෆුඩ් සීක්‍රට්"** ව්‍යාපාරයට අලෙවි කරයි. ජනවාරි මාසයේ ගොරකා පේස්ට් කප් 100ක් නිපදවා**"ෆුඩ් සීක්‍රට්"** ව්‍යාපාරයට අලෙවිකර ඇති අතර ඇයට වැය වූ වියදම් පහත දැක්වේ.

| | |
|---|---|
| ගොරකා මිලට ගැනීම සඳහා | රු. 2 500 |
| විදුලිය ගාස්තු | රු. 1 500 |
| අත්උදවුකරුගේ වැටුප් | රු. 3 000 |
| ඇසුරුම් සඳහා | රු. 200 |

තිළිණි විසින් ගොරකා ඇඹරුම් යන්ත්‍රයක් රු.37 500කට මිලදී ගෙන ඇති අතර එහි ඵලදායී ජීව කාලය අවු.10ක් සහ සුන්බුන් අගය රු.1 500ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**"ෆුඩ් සීක්‍රට්"**ව්‍යාපාරයේ ඉදිරි මාසයේ අලෙවිය 10%කින් ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් මෙම නිෂ්පාදිත අවට නගරවල හෝටල් හා ආපනශාලාවලට ගෙන ගොස් අලෙවි කිරීම සඳහා 2018.01.31දින අමරසේන සතු රු.500 000ක් වටිනා වෑන් රථය ව්‍යාපාරයට යෙදවූ අතර, ඒ සඳහා සේවකයකු බඳවා ගැනීමටත් ඔහු තීරණය කර ඇත.

(i) (අ) ඉහත සිද්ධියේ සඳහන් සේවා සැපයීමේ ව්‍යාපාරයක් ලියන්න.

(ආ) රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයක් ලියන්න.

(ii) "ෆුඩ් සීක්‍රට්" ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන ක්‍රමය (වර්ගය)නම් කර වාසි හා අවාසි දෙක බැගින් ලියන්න.

(iii) (අ)"ෆුඩ් සීක්‍රට්"ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන ඉහත සිද්ධියේ සඳහන් පාර්ශ්ව දෙකක් නිදසුන් සහිතව දක්වන්න.

(ආ) අලෙවිය 10%කින් ඉහළ නැංවීමට තීරණය කිරීම කුමන කළමනාකරණ කාර්යයට අයත් වේ ද?

(iv) මෙම සිද්ධියේ සඳහන් "හෝටල් හා ආපනශාලාවලට නිෂ්පාදිත ගෙන ගොස් අලෙවි කිරීම සිල්ලර වෙළෙඳාමයි." මෙම ප්‍රකාශයට ඔබ එකඟවන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(v) (අ) 2018.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව දක්වන්න.

(ආ) "ෆුඩ් සීක්‍රට්" ව්‍යාපාරයේ ජනවාරි මාසයේ ගැනුම් වට්නාකම කොපමණද?

(vi) අමරසේන සතු වෑන් රථය ව්‍යාපාරයට යෙදවීමේ දී අදාළ වන ජර්නල් සටහන අගයන් සහිතව ලියා දක්වන්න.

(vii) (අ) 2018.01.31 දිනට "ෆුඩ් සීක්‍රට්"ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම්වල ධාරණ අගය කොපමණද?

(ආ) "ෆුඩ් සීක්‍රට්" ව්‍යාපාරය භාවිතා කරන මූලාශ්‍ර ලේඛන හා මූලික පොත් දෙක බැගින් නම් කරන්න.

(viii) 2018.01.31 දිනට මුදල් ශේෂය ගණනය කරන්න.

(ix) 2018.01.31 දිනෙන් අවසන් මාසය සඳහා "ෆුඩ් සීක්‍රට්"ව්‍යාපාරයේ වෙළෙඳ ගිණුම සකස් කර විකුණුම් පිරිවැය සහ දළ ලාභය ගණනය කරන්න.

(x) (අ) ගොරකා පේස්ට් කප් එකක පිරිවැය ගණනය කරන්න.

(ආ) තිළිණි 20%ක ලාභාන්තිකයක් සහිතව අලෙවි කළේ නම් ඇය ලැබූ ලාභය කොපමණ ද?

(ලකුණු 2 x 10 = මුළු ලකුණු 20)

**I කොටස**
**ව්‍යාපාර අධ්‍යයනය**
**(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)**

02.

(i) (අ)අවශ්‍යතා හා වුවමනා වෙන වෙනම නිර්වචනය කරන්න.
(ආ) ලාභඅපේක්ෂිත ව්‍යාපාරවල පොදුවේ දැකිය හැකි අරමුණු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ජීවත්වීම සඳහා යම් වුවමනාවක් සපුරා ගැනීම අනිවාර්ය වේ.
(ආ) ව්‍යාපාර සඳහා යෙදවෙන කායික හා මානසික දායකත්වය ව්‍යවසායකත්වය ලෙස හඳුන්වයි.
(ඉ) ව්‍යාපාරයේ බාහිර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් අවස්ථා හා තර්ජන හඳුනාගත හැකිය.
(ඊ) තනි පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීම තුළින් ව්‍යාපාරයට අනන්‍යතාවක් ලැබේ.

(ලකුණු 02)

(iii) පාසල්වලින් ලැබෙන ඇණවුම් අනුව නවීන මහන යන්ත්‍ර වර්ග කිහිපයක් යොදාගෙන සිසුන්ට අවශ්‍ය ටයි සහ බැජ් (නිල ලාංඡන) නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් සහන් විසින් පවත්වාගෙන යනු ලබයි.

(අ) සහන්ගේ ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක්ද?
(ආ) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි නිෂ්පාදන සාධක සඳහා නිදසුන් දෙකක් ලියන්න.

(ලකුණු 02)

(iv) පෙර පාසල් ඩිප්ලෝමාධාරිණියක් වන මිෂෙල්, සේවිකාවන් දෙදෙනෙකුගේ ද සහය ඇතිව රජයේ මහල් නිවාස සංකීර්ණයක් අසල පෙර පාසලක් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබයි.

(අ) සිද්ධියේ සඳහන් අභ්‍යන්තර පරිසරයට අයත් ඇල්මැති පාර්ශ්ව දෙකක් නම් කරන්න.
(ආ) මිෂෙල්ගේ ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් සහ අවස්ථාවක් නම් කරන්න.

(ලකුණු 02)
(මුළු ලකුණු 08)

03.
(i) (අ) ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කිරීමට අවශ්‍ය ලියවිලි දෙකක් නම් කරන්න.
(ආ) චෙක්පතට සම්බන්ධ පාර්ශ්ව දෙකක් ලියන්න.

(ලකුණු 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ජීවිත රක්ෂණ ඔප්පුව පැවරිය නොහැකිය.
(ආ) මාර්ග සංඥා පිළිගත් සංකේත විද්‍යුත් සන්නිවේදන මාධ්‍ය සඳහා භාවිතා කරන ක්‍රම වේ.
(ඉ) බරින් වැඩි ද්‍රව්‍ය ප්‍රවාහනය කල හැකි වීම ජල මාර්ග ප්‍රවාහනයේ විශේෂ වාසියකි.
(ඊ) සාපේක්ෂව ඒකක මිල අඩු වීම තොග වෙළෙඳාමේ ලක්ෂණයකි.

(ලකුණු 02)

(iii) (අ) ජාත්‍යන්තර වශයෙන් භාවිතා වන ප්‍රධාන ණයපත් ජාල දෙකක් නම් කරන්න.
(ආ) යසසි වීරසිංහ රු. 50,000 ක් වටිනා භාණ්ඩ තොගයක් ගහනි ධර්මසේනගෙන් මිලට ගෙන ඇයට 2018.08.10 දින චෙක්පතක් නිකුත් කරන ලදී.

ඉහත සිද්ධියෙහි තොරතුරු චෙක්පතේ පිළිපතෙහි සඳහන් වන ආකාරයට ලියන්න.

(ලකුණු 02)

(iv) (අ) ශ්‍රී ලංකාව අපනයනය හා ආනයනය කෙරෙන භාණ්ඩ වර්ග කිහිපයක් පහත දැක්වේ.
මැණික්, තිරිඟු පිටි, කැපූ පොල්, මෝටර් රථ, සිමෙන්ති, මිනිරන්

ඉහත භාණ්ඩ වර්ග අතුරෙන් අපනයනය හා ආනයනය කෙරෙන භාණ්ඩ වෙන් කර දක්වන්න.

(ආ) හය ශ්‍රේණියේ ඉගෙනුම ලබන කසුන් පාසලේදී ක්‍රීඩා කරමින් සිටියදී හදිසියේ වැටීමෙන් අනතුරකට ලක්විය. පංති භාර ගුරුවරයා කසුන්ගේ මවට මේ බව දුරකථනයෙන් දැනුම් දෙන ලදී.

ඉහත සඳහන් සිද්ධිය ඇසුරෙන් සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංගවලට නිදසුන් සපයන්න.

යවන්නා : ....................................................
පණිවුඩය : ....................................................
මාධ්‍ය : ....................................................
ලබන්නා : .................................................... (ලකුණු 02)

(මුළු ලකුණු 08)

04.
(i) (අ) භාණ්ඩාගාර බිල්පත් යන්න කෙටියෙන් හඳුන්වන්න.
(ආ) ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී සැලකිය යුතු ප්‍රධාන කරුණු දෙකක් නම් කරන්න.

(ලකුණු 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

(අ) සාමාන්‍ය කොටස් මිලදී ගැනීමෙන් සංස්ථාපිත සමාගමක හිමිකරුවකු බවට පත්විය හැකියි.

(ආ) මිලදී ගත් සාමාන්‍ය කොටස් ණය ලබා ගැනීමේදී ඇප සුරැකුම් ලෙස ඉදිරිපත් කල නොහැක.

(ඉ) අයිතිකරු තම ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම සඳහා යන්ත්‍රයක් මිලදී ගැනීමට තීරණය කරයි.මෙය කළමනාකරණයේ සැලසුම්කරණ කාර්යයට අයත් ය.

(ඊ) ආයතනයක අවම සම්පත් ප්‍රමාණයකින් උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි සම්පත් භාවිත කිරීම සඵලදායකත්වය නම් වේ.

(ලකුණු 02)

(iii) විද්‍යාලයීය වාණිජ දින උත්සවයේ ක්‍රියාවලින් කිහිපයක් පහත සඳහන් වේ.

(අ) වාණිජ දින උත්සවය පවත්වන ආකාරය හා අවශ්‍ය අරමුදල් සපයා ගන්නා ආකාරය තීරණය කිරීම.

(ආ) එක් එක් කමිටු ප්‍රධානීන්ට අවශ්‍ය තොරතුරු හා උපදෙස් ලබා දීම.

(ඉ) සැලසුම් කළ ආකාරයට අදාළ උත්සවයේ කටයුතු වේ දැයි සොයා බැලීම හා එසේ නොවේ නම් එයට පිළියම් යෙදීම.

(ඊ) උත්සවය සාර්ථක කර ගැනීම සඳහා එක් එක් කමිටු සඳහා ප්‍රධානීන් පත් කිරීම.

ඉහත සඳහන් ක්‍රියාවලින් අයත් කළමනාකරණ කාර්යයන් සඳහන් කරන්න.

(ලකුණු 02)

(iv) බිස්කට් නිෂ්පාදනය කරන ආයතනයක් ඉහළ ගුණත්වයෙන් යුත් නව බිස්කට් වර්ගයක් නිෂ්පාදනය කර ආකර්ශණීය ඇසුරුමක් සහිතව මිල රු. 78/- ක් ලෙස සඳහන් කර නගරයේ හෝටල් සහ අනෙකුත් වෙළෙඳසැල්වල අලෙවි කිරීමට කටයුතු කරන ලදී. නිෂ්පාදනය පිළිබඳ පාරිභෝගිකයන් දැනුවත් කිරීම සඳහා ප්‍රචාරණ දැන්වීම් නගරය පුරා ප්‍රදර්ශනය කරන ලදී.

අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් සඳහන් කර ඊට අදාළව ඉහත සිද්ධිය ඇසුරෙන් නිදසුන් 2 ක් දක්වන්න.

(ලකුණු 02)

(මුළුලකුණු 08)

**IIකොටස**

**ගිණුම්කරණය**

**(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)**

05.

(i) (අ)යසසි පැහැසරාගේ ව්‍යාපාරයේ පහත දක්වා ඇති අයිතම වත්කම් හා වගකීම් යන ශීර්ෂ යටතේ වර්ග කරන්න.

| | | |
|---|---|---|
| A - බැංකු ණය | B - මෝටර් රථ | C - ණය හිමියෝ |
| D - ණය ගැතියෝ | E - ගොඩනැගිලි | F - බැංකු අයිරාව |
| G - ස්ථාවර තැන්පතු | H - උපචිත වියදම් | |

(ආ) වත්කමක් හා වගකීමක් හඳුනා ගැනීමේ ලක්ෂණ කිහිපයක් තිබේ. ඉන් වත්කමකට මෙන්ම වගකීමකට ද පොදු ලක්ෂණය කුමක් ද? (ලකුණු 02)

(ii) එක්තරා ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක බලපෑම ගිණුම්කරණ සමීකරණය අනුසාරයෙන් පහත පරිදි දක්වා ඇත.

| දිනය | වත්කම් = | හිමිකම් + | වගකීම් |
|---|---|---|---|
| ජන.01 | වැඩිවේ | වැඩිවේ | - |
| ජන.05 | වැඩිවේ<br>අඩුවේ | - | - |
| ජන.10 | වැඩිවේ | - | වැඩිවේ |
| ජන.15 | අඩුවේ | අඩුවේ | අඩුවේ |

මෙම ගිණුම්කරණ සමීකරණයට අනුව එක් එක් දින අපේක්ෂා කළ හැකි ගණුදෙනු වටිනාකම් සහිතව එක බැගින් දක්වන්න. (ලකුණු 02)

(iii) ගහනි පුන්සරාගේ ව්‍යාපාරයේ 2018 ජනවාරි මාසය තුළ සිදු වූ ගනුදෙනුවලට අදාළ මුදල් පොත පහත දැක්වේ.

හර මුදල් පොත බැර

| දිනය | ලෙ. අ. | විස්තරය | ස. පි. | වට්ටම් (රු.) | මුදල (රු.) | දිනය | ව.අ. | විස්තරය | ස. පි. | වට්ටම් (රු.) | මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1/1 | | ඉ/ගෙ/ශේෂය | | | 30 000 | 1/10 | | ගැනුම් | | | 8 000 |
| 1/8 | | විකුණුම් | | | 12 000 | 1/12 | | හසරැල්(ණයහිමි) | | 500 | 4500 |
| 1/15 | | විහඟ(ණය ගැති) | | 1 000 | 10 000 | 1/16 | | විදුලිය | | | 500 |
| 1/18 | | බැංකුණය | | | 15 000 | 1/20 | | ගැනිලි | | | 10 000 |
| | | | | | | 1/25 | | මෝටර් රථ | | | 30 000 |
| | | | | | | 1/31 | | ප/ගෙ/ශේෂය | | | 14 000 |
| | | | | 1 000 | 67000 | | | | | 500 | 67000 |

ඉහත මුදල් පොතෙහි ඇතුළත් ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමට අදාළව දුන් වට්ටම්, ලද වට්ටම් ඇතුළුව ද්විත්ව සටහන් 4ක් ලියන්න.

(ලකුණු 04)

(iv) හසරැල්ගේ ව්‍යාපාරයේ තොරතුරු පහත දැක්වේ.

සුළු මුදල් අග්‍රිමය රු.2 000

2018 ජනවාරි මාසයේ සුළු මුදල් ගෙවීම්වල එකතුව රු. 1 850

2018 පෙබරවාරි මාසයේ 01 දින සුළු වියදම් ප්‍රතිපූර්ණය සිදු විය.

2018 පෙබරවාරි සුළු මුදල් ගෙවීම් පහත පරිදි වේ.

| දිනය | විස්තරය | රු. | |
|---|---|---|---|
| පෙබ. 02 | ගමන් ගාස්තු | 80 | (ව.අ.01) |
| පෙබ. 03 | කපිලට වැටුප් අත්තිකාරම් ගෙව්වා | 200 | (ව.අ.02) |
| පෙබ. 10 | පෑන් පැන්සල් සඳහා | 100 | (ව.අ.03) |
| පෙබ. 12 | සීනි තේකොළ | 120 | (ව.අ.04) |
| පෙබ. 15 | බස් ගාස්තු | 100 | (ව.අ.05) |
| පෙබ. 17 | සී.ආර්.පොත් 2යි | 160 | (ව.අ.06) |
| පෙබ. 20 | සිසිල්බීම | 100 | (ව.අ.07) |

(අ) ගමන්, සංග්‍රහ, ලිපිද්‍රව්‍ය යන විශ්ලේෂණ තීරු සහිතව සුළු මුදල් පොත පිළියෙල කර අග්‍රිමය ප්‍රතිපූර්ණය කරන්න.

(ආ) විශ්ලේෂණ තීරුවල එකතුව ලෙජරයට පිටපත් කරන්න.

(ලකුණු 04)

(මුළුලකුණු 12)

06.

(i) (අ) ව්‍යාපාරයක පවතින ජංගම නොවන වත්කම් සඳහා නිදසුන් හතරක් නම් කරන්න.

(ආ) පොදු ජර්නලයේ සටහන් කෙරෙන ගනුදෙනු වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) කපිල පාසල් දරුවන්ට අවශ්‍ය ළමා මේස නිෂ්පාදනය කිරීමේ නියැලී සිටී. ඔහුගේ ව්‍යාපාරයේ වඩු කාර්මිකයන් දෙදෙනෙකු සහ මුරකරුවකු සේවයේ යෙදී සිටී.

පහත දැක්වෙන්නේ 2018 ජනවාරි මාසයේ ළමා මේස නිෂ්පාදනයට අදාළ තොරතුරුය.

| | |
|---|---|
| දැව සඳහා | රු. 80 000 |
| යකඩ සඳහා | රු. 150 000 |
| එක් වඩු කාර්මිකයකුගේ වැටුප | රු. 20 000 |
| වඩු කම්හල් කුලිය | රු. 12 000 |
| මුරකරු වැටුප | රු. 15 000 |
| යන්ත්‍ර ක්ෂය | රු. 20 000 |
| වෙනත් (තීන්ත, ඇණ, වැලිකඩදාසි) | රු. 8 000 |

**ජනවාරි මාසයේ දී ළමා මේස** 100 ක් **නිෂ්පාදනය** කර ඇති අතර, ළමා මේසයක **පිරිවැයට 20%ක ලාභාන්තිකයක් එකතු කර විකුණුම් මිල තීරණය කර ඇත.**

**අවශ්‍ය වන්නේ;**

(අ) ප්‍රාථමික පිරිවැය ගණනය කිරීම.

(ආ) මුළු පිරිවැය ගණනය කිරීම.

(ඉ) ළමා මේසයක පිරිවැයගණනය කිරීම.

(ඊ) ළමා මේසයක විකුණුම් මිල ගණනය කිරීම. (ලකුණු 02)

(iii) පුන්සරාගේ ව්‍යාපාරයේ 2018 ජනවාරි මාසයේ පිළියෙල කළ බැංකු ගිණුම සහ බැංකුව විසින් එවන ලද බැංකු ප්‍රකාශය සැසඳීමේ දී පහත තොරතුරු සොයා ගන්නා ලදී.

- තැන්පත් කළ නිෂ්කාශනය වූ චෙක්පත්වල වටිනාකම රු. 20 000
- නිකුත් කළ බැංකුවට ඉදිරිපත් වූ චෙක්පත්වල වටිනාකම රු. 14 000
- තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම රු.15 000
- නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම රු. 10 000
- බැංකු ගාස්තු, චෙක්පොත් ගාස්තු පිළිවෙලින් රු.3 000, රු.1 200
- ලාභාංශ, සෘජු ප්‍රේෂණ පිළිවෙලින් රු.10 000, රු.30 000

අවශ්‍ය වන්නේ ;

(අ) බැංකු ගිණුමේ ශේෂයට වඩා බැංකු ප්‍රකාශනයේ ශේෂය අඩු වීමට බලපාන කරුණු මොනවා ද?

(ආ) බැංකු ගිණුම සංශෝධනයට ගන්නා තොරතුරු මොනවා ද?

(ලකුණු 04)

(iv) පැහැසරාගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ බැර පැත්ත රු.500ක අඩුවක් පෙන්නුම් කළ හෙයින් ව්‍යාපාරයේ ගිණුම් ලිපිකරු ගිණුම් පරීක්ෂා කිරීමේ දී පහත දෝෂ සොයා ගන්නා ලදී.

- රක්ෂණ වාරික ලෙස ගෙවූ රු.1 000ක් දෙවරක් පොත්වල සටහන් වීම.
- රු.5 500 කට ණයට විකුණුම්, විකුණුම් ගිණුමට සටහන් කර තිබුණේ රු.5 000ක් ලෙසය.
- රු.5 000ක ගැණුම් ඉන්වොයිසියක් ගිණුම් පොත්වල සටහන් නොවීම.

අවශ්‍ය වන්නේ;

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්

(ආ) අවිනිශ්චිත ගිණුම (ලකුණු 04)

(මුළු ලකුණු 12)

07.

(i) (අ) ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ප්‍රධාන අරමුණු දෙක කුමක් ද?

(ආ)ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධානයක ප්‍රධාන ආදායම් මාර්ගය නම් කරන්න. (ලකුණු 02)

(ii) සුපර් හීරෝ ක්‍රීඩා සමාජයේ 2017 වර්ෂයේ පිළියෙල කළ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

ලැබීම් හා ගෙවීම් ගිණුම

| | රු. | | රු. |
|---|---|---|---|
| මුදල් ශේෂය | 2 000 | ක්‍රීඩා උපකරණ ගැනුම් | 4 000 |
| සාමාජික මුදල් | 4 000 | මුරකරු වැටුප් | 1 000 |
| පරිත්‍යාග | 1 000 | දුරකථන ගාස්තු | 500 |
| | | ප/ගෙ ශේෂය | 1 500 |
| | 7 000 | | 7 000 |
| ඉ/ගෙ ශේෂය | 1 500 | | |

අතිරේක තොරතුරු

- සාමාජික සංඛ්‍යාව 50කි. වාර්ෂික සාමාජික ගාස්තුව රු. 100 කි .

**අවශ්‍ය වන්නේ;**

➤ සුපර්හීරෝ ක්‍රීඩා සමාජයේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය (ලකුණු 02)

(iii) විහඟ රන්සර ව්‍යාපාරයේ 2017.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| විකුණුම් ............................................................... | | 100 000 |
| ගැනුම් ............................................................... | 30 000 | |
| 2017.01.01 දිනට තොගය.................................... | 5 000 | |
| ඉඩම් ............................................................... | 50 000 | |
| ගොඩනැගිලි(පිරිවැයට)........................................ | 100 000 | |
| සේවක වේතන .................................................... | 5 000 | |
| ලද වට්ටම් ........................................................ | | 4 000 |
| දුන් වට්ටම් ....................................................... | 1 000 | |
| 8% බැංකු ණය.................................................... | | 20 000 |
| ණය ගැතියෝ .................................................... | 10 000 | |
| ණය හිමියෝ ..................................................... | | 12 000 |
| බැංකු ණය පොලී ............................................. | 1 000 | |
| රක්ෂණ ගාස්තු.................................................... | 500 | |
| 2017.01.01 ට ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීම | | 20 000 |
| මුදල්.................................................... | 3 000 | |
| පැටවුම් කුලී .................................................... | 1 000 | |
| ප්‍රාග්ධනය.................................................... | | 50 500 |
| | 206 500 | 206 500 |

අතිරේක තොරතුරු,

01. 2017/12/31 දිනට ඉතිරි තොගය රු.3000කි.

02. ගොඩනැගිලි වාර්ෂික ව 5% බැගින් ක්ෂය කරයි.

03. ණය ගැතියන්ගේ 10%ක් බොල් ණය ලෙස කපා හැරිය යුතුයි.

**අවශ්‍ය වන්නේ,**

(අ) 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය

(ආ) 2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය. (ලකුණු 08)

(මුළු ලකුණු 12)

***

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
## සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ මාලාව
## ව්‍යාපාර සහ ගිණුම්කරණ අධ්‍යයනය
## පෙරහුරු ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු
## II පත්‍රය

(1)

i. (අ)"ෆුඩ් සීක්‍රට්" ව්‍යාපාරය/ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (ලකුණු 01)

(ආ) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (ලකුණු 01)

ii. ඒක පුද්ගල ව්‍යාපාර/ තනි පුද්ගල ව්‍යාපාර (ලකුණු 01)
කේවල ස්වාමි ව්‍යාපාර

<u>වාසි</u>

- පහසුවෙන් ආරම්භ කළ හැකිවීම.
- සියළුම ලාභ අයිතිකරු සතු වීම.
- ව්‍යාපාරික තොරතුරුවල රහස්‍ය බව ආරක්ෂා වීම.
- තීරණ ගැනීමේ ස්වාධීන බව.
- තම දක්ෂතා උපරිමව යෙදිය හැකි වීම.

<u>අවාසි</u>

- අයිතිකරුගේ වගකීම අසීමිත වීම.
- ප්‍රාග්ධනය රැස්කර ගැනීමේ දුෂ්කරතා
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
- නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.
- තනිතීරණ ඇතැම්විට අසාර්ථක වීම. (ලකුණු 01)

iii. (අ) අයිතිකරු - අමරසේන
සැපයුම්කරු - ගෝල්ඩන් ස්පයිසි ආයතනය/ තිළිණි (ලකුණු 01)

(ආ) සැලසුම්කරණය (ලකුණු 01)

iv. නැත (ලකුණු 01)

සිල්ලර වෙළෙඳාම යනු අවසාන පාරිභෝජනය සඳහා අලෙවි කිරීමයි. (ලකුණු 01)
නැවත විකිණීමේ අරමුණ ඇතිව ව්‍යාපාරවලට භාණ්ඩ විකිණීම තොග වෙළඳාමයි.

v. (අ) වත්කම් = හිමිකම්

| වත්කම් | හිමිකම් |
|---|---|
| රු. | රු. |
| 150 000 | 150 000 |

(ලකුණු 01)

(ආ) අත්පිට ගැනුම් = 40 000
ණයට ගැනුම් = <u>20000</u>
මුළු ගැනුම් = <u>60 000</u> (ලකුණු 01)

vi. මෝටර් රථ ගිණුම හර - රු. 500000
ප්‍රාග්ධන ගිණුම බැර - රු. 500 000 (ලකුණු 02)

vii. (අ) ලී බඩු රු. 119 800/- (ලකුණු 01)

(ආ) ලදුපත
වවුචරය මුදල් පොත
ගැනුම් ඉන්වොයිසිය ගැනුම් ජ'ර්නලය (ලකුණු 01)
ජ'ර්නල් වවුචරය පොදු ජ'ර්නලය

viii.

මුදල් පොත

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 150 000 | ලීබඩු උපකරණ | 20 000 |
| අත්පිට විකුණුම් | 120000 | ගැනුම් | 40 000 |
| | | විදුලිය | 3 000 |
| | | ගොඩනැගිලි කුලී | 15000 |
| | | විවිධ වියදම් | 2 800 |
| | | 2018.01.31 ශේෂය ප/ගෙ | 189 200 |
| | 270000 | | 270000 |

(ලකුණු 02)

ix.

වෙළෙඳ ගිණුම (ලකුණු 01)

| | | | | | |
|---|---|---|---|---|---|
| ආරම්භක තොගය | – | – | විකුණුම් | | 120 000 |
| ගැනුම් | 60 000 | 60 000 | | | |
| | | 60 000 | | | |
| අඩු කළා | | | | | |
| අවසාන තොගය | | (10 000) | | | |
| විකුණුම් පිරිවැය | | 50 000 | | | |
| දළ ලාභය | | 70 000 | | | |
| | | 120 000 | | | 120 000 |

(ලකුණු 02)

x. (අ) ගොරකා ගැණුම් 2 500
විදුලිය ගාස්තු 1 500
අත් උදව්කරුගේ වැටුප් 3 000
ඇසුරුම් සඳහා 200
ඇඹරුම් යන්ත්‍ර ක්ෂය 300
7 500

මුළු පිරිවැය = 7 500

ඒකක පිරිවැය $\frac{7\ 500}{100}$ = රු.75 කි. (ලකුණු 01)

(ආ) රු. 1 500/- (ලකුණු 01)

(2)

i. (අ) අවශ්‍යතා යනු

ජීවත්වීම සඳහා මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරාගත යුතු දෑය.

වුවමනා යනු

මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ආකාරයන්ය. (ලකුණු 01)

(ආ) i.ලාභ ඉපැයීම
ii. පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම. (ලකුණු 01)

ii. (අ) - අසත්‍යයි

(ආ) - අසත්‍යයි

(ඉ) - සත්‍යයි

(ඊ) - සත්‍යයි (ලකුණු½× 04 = 02)

iii. (අ) ඇඳුම්/ ඇඳුම් පැළඳුම් (ලකුණු 01)

(ආ) ප්‍රාග්ධනය - මහන යන්ත්‍ර
ව්‍යවසායකත්වය - සහන්ගේ ව්‍යාපාරික හැකියාව (ලකුණු 01)

iv. (අ) අයිතිකරු - මිෂෙල්

සේවකයෝ - සේවිකාවන් දෙදෙනා (ලකුණු 01)

(ආ) ශක්තියක් - මිෂෙල් පෙර පාසල් ඩිප්ලෝමාධාරිනියක් වීම.

අවස්ථාවක් - රජයේ මහල් නිවාසයක් අසල ව්‍යාපාරය පිහිටා තිබීම. (ලකුණු 01)

(3)

i.(අ) අයදුම්පත, මුදල් තැන්පතු පත, ජාතික හැඳුනුම්පත, දේශීය ආදායම් පනතට අනුව කරන ප්‍රකාශය (ලකුණු 01)

(ආ) අණකරු, අණලද්, ආදායකයා (ලකුණු 01)

ii. (අ) සත්‍යයි (ආ) අසත්‍යයි

(ඉ) සත්‍යයි (ඊ) සත්‍යයි (ලකුණු 02)

iii. (අ) වීසා, මාස්ටර්, ඇමරිකන් එක්ස්ප්‍රස්, ඩිස්කවර් (ලකුණු 01)

(ආ) දිනය - 2018.08.10

- ගඟනි ධර්මසේන

වටිනාකම - රු. 50 000 (ලකුණු 01)

භාණ්ඩ තොගයක් මිලදී ගැනීම.

iv. (අ)

| <u>අපනයනය</u> | <u>ආනයනය</u> |
|---|---|
| • මැණික් | • තිරිඟු පිටි |
| • කැපූ පොල් | • මෝටර් රථ |
| • මිනිරන් | • සිමෙන්ති |

(ලකුණු 01)

(ආ) යවන්නා :- 6 ශ්‍රේණියේ පන්තිභාර ගුරුවරයා

පණිවුඩය :- කසුන් ක්‍රීඩා පිටියේදී අනතුරකට ලක්විය.

මාධ්‍ය :- විද්‍යුත්/ වාචික

ලබන්නා :- කසුන්ගේ මව

(ලකුණු 01)

(4)i. (අ)භාණ්ඩාගාර බිල්පතක් යනු රජයේ කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන කෙටි කාලීන සුරැකුම්පත් වර්ගයකි. (ලකුණු 01)

(ආ) අරමුණ, අවදානම, ප්‍රතිලාභ (ලකුණු 01)

ii. (අ) සත්‍යය (ආ) අසත්යය (ඉ) සත්‍යය (ඊ) අසත්‍යය (ලකුණු 02)

iii. (අ) සැලසුම්කරණය

(ආ) මෙහෙයවීම

(ඉ) පාලනය

(ඊ) සංවිධානකරණය (ලකුණු 02)

iv. නිෂ්පාදිතය - පෝෂ්‍යාදායි බිස්කට්/ ඇසුරුම

මිල - සඳහන් මිල රු. 78/-

ස්ථානය - නගරයේ හෝටල්/ අනෙකුත් වෙළෙඳසැල්

ප්‍රවර්ධනය - ප්‍රචාරණ දැන්වීම් (ලකුණු 02)

(5)

i. (අ)

| වත්කම් | වගකීම් |
|---|---|
| B<br>D<br>E<br>G | A<br>C<br>F<br>H |

(ලකුණු 01)

(ආ) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවීම. (ලකුණු 01)

ii. ජන.01 ප්‍රාග්ධනය මුදලින් හා ස්ථාවර වත්කම්වලින් යෙදවීම./ පිළිගත හැකි වෙනත් කරුණු

ජන.05 භාණ්ඩ තොග මිලට ගැනීම.
ස්ථාවර වත්කම් මිලට ගැනීම (මෝටර් රථ, ගොඩනැගිලි)
ස්ථාවර තැන්පතු, ආයෝජනය, මිලට ගැනීම/ පිළිගත හැකි වෙනත් කරුණු

ජන.10 බැංකු ණය
භාණ්ඩ තොග ණයට ගැනීම.

ජන.15 බැංකු ණය වාරික පොලිය ද සමඟ ගෙවීම

(ලකුණු ½x 4 =2)

iii. 01/08 මුදල් හර රු.12 000 විකුණුම් ගිණුම බැර රු. 12 000

01/10 ගැනුම් ගිණුම හර රු. 8 000 මුදල් ගිණුම බැර රු. 8 000

01/12 ණය හිමියන් හර රු. 5 000 මුදල් බැර රු. 4 500 ලද වට්ටම් බැර රු. 500

01/15 මුදල් හර රු. 10 000 දුන් වට්ටම් හර රු. 1 000 ණය ගැති බැර රු. 11 000

01/16 විදුලිය හර රු.500 මුදල් බැර රු.500

01/18 මුදල් හර රු. 15 000 බැංකු ණය බැර රු.15000

01/20 ගැනිලි හර රු. 10000 මුදල් බැර රු.10000

01/25 මෝටර් රථ හර රු.30000 මුදල් බැර රු.30000

(ලකුණු 04)

iv. (අ)

හසරැල්ගේ ව්‍යාපාරයේ
පෙබරවාරි මාසය සඳහා
සුළු මුදල් පොත

| ලැබීම් රු. | දිනය | විස්තරය | ල.අ | ගෙවීම් රු. | විශ්ලේෂණ තීරු | | | ලෙ.පි. |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ගමන් | සංග්‍රහ | ලිපිද්‍රව්‍ය | |
| 150(ල.½) | 020/1 | ඉ/ගෙ ශේෂය | | | | | | |
| 1 850(ල.½) | 02/01 | මුදල් | | | | | | |
| | 02/02 | ගමන් ගාස්තු | 01 | 80 | 80 | | | |
| | 02/03 | කපිලට වැ/අත්. | 02 | 200 | | | | 200 |
| | 02/10 | පෑන් , පැන්සල් | 03 | 100 | | | 100 | |
| | 02/12 | සීනි,තේ කොළ | 04 | 120 | | 120 | | |
| | 02/15 | බස් ගාස්තු | 05 | 100 | 100 | | | |
| | 02/17 | සීආර් පොත් | 06 | 160 | | | 160 | |
| | 02/20 | සිසිල් බීම | 07 | 100 | | 100 | | |
| | | | | 860 | 180 | 220 | 260 | x |
| | 02/28 | ප/ගෙ ශේෂය | | 1 140(ල.½) | | | | |
| 2 000 | | | | 2 000 | | (ල.½) | | |

(ලකුණු 02)

(ආ)

ගමන් වියදම් ගිණුම(ල.½)

| දිනය | විස්තරය | ස.පි | මුදල | දිනය | විස්තරය | ස.පි | මුදල |
|---|---|---|---|---|---|---|---|
| 02/28 | සුළු මුදල් | | 180 | | | | |

සංග්‍රහ වියදම් ගිණුම(ල.½)

| දිනය | විස්තරය | ස.පි | මුදල | දිනය | විස්තරය | ස.පි | මුදල |
|---|---|---|---|---|---|---|---|
| 02/28 | සුළු මුදල් | | 220 | | | | |

ලිපිද්‍රව්‍ය වියදම් ගිණුම(ල.½)

| දිනය | විස්තරය | ස.පි | මුදල | දිනය | විස්තරය | ස.පි | මුදල |
|---|---|---|---|---|---|---|---|
| 02/28 | සුළු මුදල් | | 260 | | | | |

කපිලගේ ගිණුම(ල.½)

| දිනය | විස්තරය | ස.පි | මුදල | දිනය | විස්තරය | ස.පි | මුදල |
|---|---|---|---|---|---|---|---|
| 02/03 | සුළු මුදල් | | 200 | | | | |

(ලකුණු 02)

(6)

i. (අ) ගොඩනැගිලි
ලීබඩු
මෝටර් රථ
යන්ත්‍ර උපකරණ

(ලකුණු 01)

(ආ) 1. ස්ථාවර වත්කම් ණයට ගැනීම
2. ගැලපුම් සටහන්
3. වැරදි නිවැරදි කිරීමේ සටහන් (ලකුණු 01)

ii.

(අ) රු.
දැව 80000

යකඩ 150000
වැටුප් 40000
ප්‍රාථමික පිරිවැය 270000 (ල.½)

(ආ) 270000
12000
15000 (ල.½)
20000
8000
මුළු පිරිවැය 325000

(ඉ) 325000 /100 = 3 250 (ල.½)

(ඊ) 3250 x20/100 = 3250
650
විකුණුම් මිල 3900 (ල.½) (ලකුණු02)

iii. (අ) තැන්පත් කල බැර නොවූ චෙක්/ නිශ්කාශනය නොවූ රු. 15 000
බැංකු ගාස්තු රු. 3 000 (ලකුණු02)
චෙක් පොත් ගාස්තු රු. 1 200

(ආ) ලාභාංශ රු.10000 සෘජු ප්‍රේෂණ රු. 30000
බැංකු ගාස්තු රු. 3000 චෙක් පොත් ගාස්තු රු. 1200 (ලකුණු 02)

iv. (අ)

පොදු ජර්නලය

| විස්තරය | හර | බැර | |
|---|---|---|---|
| | රු. | රු. | |
| මුදල්<br>රක්ෂණ<br>(රක්ෂණ වාරික දෙවරක් පොත්වල සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම.) | 1 000 | 1 000 | ලකුණු 01 |
| අවිනිශ්චිත<br>විකුණුම්<br>(5500 ක විකුණුම් 5 000ක් ලෙස සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම.) | 500 | 500 | ලකුණු 01 |
| ගැනුම්<br>ණයහිමි<br>(රු. 5 000 ක ගැනුම් ඉන්වොයිසියක සටහන් නොවීමේ වරද නිවැරදි කිරීම) | 5 000 | 5 000 | ලකුණු 01 |

(ආ)

අවිනිශ්චිත ගිණුම

| | |
|---|---|
| විකුණුම්500 | ශේෂ පිරික්සුම් වෙනස 500 |
| ලකුණු ½ | ලකුණු ½ |

(ලකුණු 04)

(07)

i. (අ) සාමාජික සුභ සාධනය, සමාජීය සුභ සාධනය (ලකුණු 01)

(ආ) සාමාජික මුදල් (ලකුණු 01)

ii.

සුපර් හීරෝ ක්‍රීඩා සමාජය
2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශය

| | | රු. | රු. |
|---|---|---|---|
| | <u>ආදායම්</u> | | |
| | සාමාජික මුදල්(50x100) (ලකුණු 01) | 5000 | |
| | පරිත්‍යාග | 1000 | 6000 |
| ල.½ | <u>වියදම්</u> | | |
| | මුරකරු වැටුප් | 1000 | |
| | දුරකථන ගාස්තු | 500 | (1500) |
| | අතිරික්තය | | 4500 (ල.½) |

(ලකුණු 02)

iii. (අ)

විහඟ රන්සර ව්‍යාපාරයේ
2017.12.31 අවසන් වර්ෂය සඳහා
ලාභ හෝ අලාභ ප්‍රකාශය (ල.½)

| | | | |
|---|---|---|---|
| විකුණු විකුණුම් | | | 100 000 |
| අඩුකළා - විකුණුම් පිරිවැය | | | |
| 2017.01.01 දිනට තොගය | | 5 000 | |
| ගැනුම් | 30 000 | | |
| පැටවුම් කුලී | 1 000 | 31 000 | |
| | | 36 000 | |
| අඩුකළා - 2017.12.31 දිනට තොගය | | (3 000) | |
| විකුණුම් පිරිවැය | | | (33 000) (ල.½) |
| දළ ලාභය | | | 67 000 (ල.½) |
| <u>වෙනත් ආදායම්</u> | | | |
| ලද වට්ටම් | | | 4 000 |
| | | | 71 000 (ල.½) |
| <u>බෙදා හැරීමේ වියදම්</u> | | | |
| බොල් ණය | 1 000 (ල.½) | | |
| දුන් වට්ටම් | 1 000 | 2 000 | |
| <u>පරිපාලන වියදම්</u> | | | |
| රක්ෂණ ගාස්තු | 500 | | |
| ගොඩනැගිලි ක්ෂය | 5 000 (ල.½) | | |
| සේවක වේතන | 5 000 | 10 500 | |
| <u>මූල්‍ය හා වෙනත් වියදම්</u> | | | |
| ණය පොළී | 1 600 (ල.½) | 1 600 | (14 100) |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට ගෙනගියා | | | 56 900 (ල.½) |

(ලකුණු 04)

(ආ)

විහඟ රන්සර ව්‍යාපාරයේ
2017.12.31 දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ල.½)

| ජංගම නොවන වත්කම් | පිරිවැය | සමුච්චිත ක්ෂය | ධාරණ අගය (ල.½) |
|---|---|---|---|
| ඉඩම් | 50 000 | _ | 50 000 |
| ගොඩනැගිලි | 100 000 | 25 000 | 75 000 |
| (ල.½) | 150000 | 25000(ල.½) | 125000 |
| ජංගම වත්කම් | | | |
| ඉතිරි තොගය | (ල.½) | 3 000 | |
| ණයගැතියෝ | (ල.½) | 9 000 | |
| මුදල් | | 3 000 | 15 000 |
| මුළු වත්කම් | | | 140 000 |
| ප්‍රාග්ධනය | | 50 500 | |
| + ශුද්ධ ලාභය | | 56 900 (ල.½) | 107 400 |
| ජංගම නොවන වගකීම් | | | |
| 8% බැංකු ණය | | 20 000 | 20 000 |
| ජංගම වගකීම් | | | |
| ණයහිමි | | 12 000 | |
| උපචිත බැංකු ණය පොළී | | 600 (ල.½) | 12 600 |
| මුළු හිමිකම් හා වගකීම් | | | 140 000 |

(ලකුණු 04)

**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

**අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍ර**

**BUSINESS & ACCOUNTING STUDIES**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

# QUESTION PAPER - I

# ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

The National e-learning Portal for The General Education

# අධ්‍යාපන අමාත්‍යාංශය

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I

## අ.පො.ස. (සා/ පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 1 යි**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරු වලින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 1-5 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

දෙනුවන් සහ නුවන් දක්ෂ වෛද්‍යවරු දෙදෙනෙකි දෙනුවන් කුලියට ගත් ගොඩනැගිල්ලක නුවන් සමඟ සමානව ප්‍රාග්ධනය යොදා වෛද්‍ය සායනයක් ආරම්භ කරන ලදී.මෙය ආරෝග්‍යා නමින් පවත්වාගෙන යනු ලැබේ.

1. මෙම සිද්ධියේ සඳහන් ආරෝග්‍යා ව්‍යාපාරය විසින් සපුරා ගනු ලබන මිනිස් අවශ්‍යතාවය කුමක්ද?

 1. ආහාර 2. ඇඳුම් 3. නිවාස 4.සෞඛ්‍ය

2. මෙම ආරෝග්‍යා ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

 1.ඒක පුද්ගල ව්‍යාපාර 2. හවුල් ව්‍යාපාර 3. සංස්ථාපිත සමාගම් 4.සේවා ව්‍යාපාර

3. මෙම ව්‍යාපාර වර්ගය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

 1.මෙය භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.

 2.මෙහි ව්‍යාපාර නාමය ලියා පදිංචි කල යුතුය.

 3.මෙය තනි ව්‍යාපාරයකි.

 4.මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගල භාවයක් ඇත.

4. කුලියට ගත් ගොඩනැගිල්ල අයත්වන නිෂ්පාදන සාධකය කුමක්ද?

 1. භූමිය 2.ශ්‍රමය 3. ප්‍රාග්ධනය 4. ව්‍යවසායකත්වය

5.ආරෝග්‍යා ව්‍යාපාරයට ශක්තියක් වන්නේ ,

 1. නුවන් වෛද්‍යවරයකු වීම.

 2. දෙනුවන් හා නුවන් වෛද්‍යවරයෙකු වීම.

 3. නුවන් ප්‍රාග්ධනයට සහභාගී වීම.

 4.කුලියට ගත් ගොඩනැගිල්ලක ව්‍යාපාරය ඇරඹීමට හැකිවීම.

6.ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් පාර්ශවයන් හා එම බලපෑම අයත් වන නිවැරදි පදය තෝරන්න.

 1.අයිතිකරුවෝ - මූල්‍ය ශක්තිය, ගණුදෙනුකරුවෝ භාණ්ඩ හා සේවා මිලදි ගැනීම.

 2.ගණුදෙනුකරුවෝ - භාණ්ඩ හා සේවා මිලදී ගැනීම, තරඟකරුවෝ-භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම

 3.අයිතිකරුවෝ- මූල්‍ය ශක්තිය, සේවකයෝ - දක්ෂතා

 4.තරඟකරුවෝ - අලෙවි උපක්‍රම, සේවකයෝ - කැපවීම

7. ව්‍යාපාර ලියාපදිංචි කිරීම සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

 1. සෑම ව්‍යාපාරයටම ලියා පදිංචි කිරීම මඟින් නීතිමය පුද්ගලභාවයක් හිමිවේ.

 2.ශ්‍රී ලංකාව තුල ආරම්භ කරන සියළුම ව්‍යාපාර ලියා පදිංචි කිරීම අනිවාර්ය වේ.

 3. සී/ස සමාගමක් සංස්ථාපනය කිරීම මඟින් නීතිමය පුද්ගලභාවයක් හිමිවේ.

 4. හවුල් ව්‍යාපාර ලියාපදිංචි කිරීම මඟින් නීතිමය පුද්ගලභාවයක් හිමිවේ.

8. තමාට ලැබුණු චෙක්පතක් යම් ගනුදෙනුවක් සඳහා වෙනත් ව්‍යාපාරිකයකුට පැවරීමේදි හෝ බැංකු ගිණුමක තැන්පත් කිරීමේදී පිටසන් කරයි. මින් තහවුරු කරන්නේ,

1.චෙක්පත පවරනු ලැබු බවයි.

2.චෙක්පත පිළිබඳ අව්‍යාජ හිමිකමක් පැවැති බවයි.

3.චෙක්පතට සම්පූර්ණ ආරක්ෂාව ඇති බවයි.

4. චෙක්පත ගනුදෙනු කිරීම සීමාවන බවයි.

9.යම් පුද්ගලයෙකුට බැංකුවකින් හරපතක් ලබා ගැනීම සඳහා අනිවාර්යයෙන්ම සපුරාලිය යුතු අවශ්‍යතාවයකි.

1.ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

2.ව්‍යාපාරිකයකු වීම.

3.බැංකුවේ ගිණුමක් පැවතිය යුතුවීම.

4.ස්ථාවර තැන්පතුවක් පවත්වාගෙන යෑම.

10.සමන්ත වසර 5ක් සඳහා රු.500,000 කට තම ජීවිතය රක්ෂණය කළේය.ගිවිසගත් අයුරින් වාරික ගෙවමින් සිටින අතරතුර ඔහු හදිසියේ මිය ගියේය. ඔහුගේ යැපෙන්නන්ට රු.500,000ක මුදලක් ගෙවීමට රක්ෂණය සමාගම කටයුතු කළේය. මීට අදාල වන හේතුව කුමක්ද?

1.හානි පූර්ණ මූලධර්මය බල නොපෑම.

2.උපරිම විශ්වාසය පිළිබඳ මූලධර්මය අනුව.

3.රක්ෂණ හිමිකම පිළබඳ මූලධර්මයට අනුව.

4.රක්ෂණ සමාගම යැපෙන්නන්ට අනුකම්පා කිරීම.

11. සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග පහත දැක්වේ.

A - මාධ්‍යය B - ලබන්නා C - ප්‍රතිචාරය

D - පණිවිඩය E - යවන්නා F -ප්‍රතිපෝෂණය

සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග නිවැරදි පිළිවෙලට දැක්වෙන පිළිතුර තෝරන්න.

1. B, A, C, D,F, E

2. C, E, A, D, B, F

3. E, D, A, B, F, C

4. E, D, A, B, C, F

12. ඉන්ධන පිරිමැසුම් දායකවන දෙමුහුන් (Hybrid) මෝටර් රථ සඳහා වර්තමානයේ ඉහළ ඉල්ලුමක් පවතී. මෙම ප්‍රකාශයට ඇතුළත්වන ප්‍රවාහන මූලිකාංගය වන්නේ,

1. මාර්ගය හා මාධ්‍යයයි.

2.බලය හා පර්යන්තයයි.

3.මාධ්‍යය හා බලයයි.

4.මාර්ගය හා පර්යන්තයයි.

13. පහත සඳහන් සිදුවීම් තුලින් අපනයන වෙළඳාමට නිදසුනක් වන්නේ,

1.පෙරේරා විසින් නුවරඑළියෙන් රු 100,000 වටිනා “ඕකිඩ්” මල් තොගයක් මිලදී ගැනීම.

2.සඳුනි ව්‍යාපාරය විදේශයෙන් හිමි ඇඳුම් තොගයක් ගෙන්වා ගැනීම.

3.විස්මිත ව්‍යාපාරය පළතුරු තොගයක් මැද පෙරදිග රටකට විකිණීම.

4.පාලිත එළවළු තොගයක් යාපනයට ප්‍රවාහනය කිරීම.

14. කෘෂි උපකරණ නිෂ්පාදන ව්‍යාපාරයක් ඒවායේ නිෂ්පාදන ක්‍රියාවලිය හා අලෙවි කටයුතු සිදුකරන ආකාරය තීරණය කිරීමට කළ යුතු කළමණාකරන කාර්යය කුමක්ද?

1. සැලසුම්කරණය.

2.සංවිධානකරණය.

3.මෙහෙයවීම.

4.පාලනය.

15.අලෙවිකරණය හැඳින්වීම සඳහා වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1.මිනිස් අවශ්‍යතා හා වුවමනා වඩාත් හොඳින් තෘප්තිමත් කළ හැකිවන භාණ්ඩ හා සේවාවන් නිර්මාණය කිරීම.

2.භාණ්ඩ හෝ සේවා පිළිබඳව පාරිභෝගික ප්‍රතිචාර සොයා බැලීම හා අලෙවියෙන් පසු සේවාවන්.

3.මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වටිනාකමකින් යුත් නිෂ්පාදිත නිර්මාණය කිරීමේ හා පිළිගැන්වීමේ ක්‍රියාවලිය අලෙවිකරණයයි.

4.ඉලක්ක පාරිභෝගික කණ්ඩායම් සඳහා භාණ්ඩ නිෂ්පාදනය කොට ඉදිරිපත් කිරීමයි.

16.ආයෝජන මාර්ගයක් ලෙස ඉතිරිකිරීමේ ගිණුමක මුදල් තැන්පත් කිරීමකට වඩා ස්ථාවර තැන්පතුවක් ඇරඹීමෙන් පුද්ගලයෙකුට ලැබිය හැකි විශේෂ ප්‍රතිලාභයකි.

1.පොලී ආදායමක් හිමිවීම.

2. ත්‍යාග හෝ ලොතරැයි දිනුම් අදීම.

3. අවශ්‍ය අවස්ථාවල මුදල් ලබා ගත හැකි වීම.

4. තැන්පතු සහතිකය ඇපයට තබා ණය මුදලක් ලබා ගත හැකි වීම.

17. එක්තරා ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පහත දැක්වේ.

| වත්කම් = | හිමිකම් + | වගකීම් |
|---|---|---|
| +25000 | + | 25000 |

ඉහත ගිණුම්කරණ සමීකරණයේ ඇති ගනුදෙනුව වන්නේ,

1.අමල්ගෙන් රු. 25000ක මුදලක් ලැබීම

2. හර්ෂගෙන් රු 25000ක භාණ්ඩ තොගයක් ලබා ගැනීම.

3. ණය හිමියෙකුට රු. 25000ක් ගෙවීම.

4. ණය ගැතියෙකුගෙන් රු. 25000ක් ගබා ගැනීම.

18. පහත ගනුදෙනු අතරින් හිමිකම වැඩි වීමට බලපාන ගනුදෙනුව වන්නේ,

1. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට රු. 20000ක මුදලක් ලබා ගැනිම.

2. රු. 30000ක සේවක වැටුප් ගෙවීම.

3. රු.50000ක අමතර ප්‍රාග්ධන ආයෝජනය කිරීම.

4. කඩකුලී ආදායම් ලෙස රු. 12000ක් ලැබිය යුතුය.

පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 19 හා 20ට පිළිතුරු සපයන්න.

සරසි ව්‍යාපාරය තුල සිදුවූ ගනුදෙනු වලින් උපුටාගත් පහත තොරතුරු සපයා ඇත.

| අයිතමය | වෙළඳ වට්ටම් | ලකුණුකළ මිල |
|---|---|---|
| ණයට විකුණුම් | 10% | 80,000 |

ණය ගැතියන් ගේ මුදල් ලබා ගැනීමේදී මසක් ඇතුළත මුදල් ගෙවන ණය ගැතියන්ට 5% ක මුදල් වට්ටමක් හිමිවේ.

19. සරසි ව්‍යාපාරයේ ණය ගැතියන්ට ලබා දුන් මුදල් වට්ටම කොපමණද?

1. රු 7200 කි 2. රු 3800 කි 3.රු 3600 කි 4. රු 8000 කි

20. ණය ගැතියන්ගෙන් මුදල් ලැබීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

1. මුදල් ගිණුම හර රු. 68400
   දුන්වට්ටම් ගිණුම හර රු 3600
   ණය ගැතියෝ බැර රු.72000

2. මුදල් ගිණුම හර රු. 72000
   දුන්වට්ටම් ගිණුම හර රු 8000
   ණය ගැතියෝ බැර රු.80000

3. මුදල් ගිණුම හර රු. 80000
   දුන්වට්ටම් ගිණුම හර රු 8000
   ණය ගැතියෝ බැර රු.88000

4. මුදල් ගිණුම හර රු. 76000
   දුන්වට්ටම් ගිණුම හර රු 4000
   ණය ගැතියෝ බැර රු.80000

21. පහත X තීරුවේ මූලික පොත් වර්ගයද Y මූලාශ්‍ර ලේඛණයද වේ.

| X | Y |
|---|---|
| 1. ගැණුම් ජ'නලය | A සුළු මුදල් වවුචරය |
| 2. සුළු මුදල් පොත | B ජ'නල් වවුචරය |
| 3. බැංකු ගිණුම | C ඉන්වොයිසිය |
| 4. පොදු ජ'නලය | D පිළිපත |

ඉහත X තීරුවේ මූලික පොත්වලට අදාලව Y තීරුවේ තිබෙන මූලාශ්‍ර ලේඛන ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ,

1. C, A, D, හා B ය. 3. C, D, A, හා B ය.
2. C,D, B, හා A ය. 4. C,A,B, හා D ය

22.ව්‍යාපාරයක ලෙජරයේ දැක්වෙන කොමිස් ආදායම ගිණුම ......1..........................ගිණුමක් වන අතර කාර්යාල උපකරණ ගිණුම ............2.................... ගිණුමක් වේ.

ඉහත ප්‍රකාශනයේ 1 හා 2 ස්ථානවලට අදාල නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1.ආදායම්, වියදම් 2.ආදායම්, වත්කම්

3.ආදායම්, වගකීම්. 4. ආදායම්, හිමිකම්

23. පහත සඳහන් ගනුදෙනු අතරින් පොදු ජ'නලයේ සඳහන් කළයුතු ගනුදෙනු තෝරන්න.

1. ව්‍යාපාරයේ අයිතිකරු රු. 150,000ක අමතර ප්‍රාග්ධනය යෙදීම.
2. අයිතිකරුගේ පෞද්ගලික ප්‍රයෝජනයට රු. 25000ක් ලබා ගැනීම.
3. ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු.50,000ක යන්ත්‍රයක් ණයට ගැනීම.
4. රු.30000ක භාණ්ඩ තොගයක් නැවත විකිණීම සඳහා ණයට ගැනීම.

24. 2018.08.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හර ශේෂය රු 24750ක් වූ අතර එදිනට බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය රු.14750ක් වූ අතර, මෙම වෙනසට හේතු වූ ගනුදෙනු වන්නේ,

1. ණය ගැති සෘජු ප්‍රේෂණ රු.10000කි.
2. ණයහිමියෙකුට නිකුත් කළ රු.10000ක චෙක්පත අහරුවී ඇත
3. ස්ථාවර නියෝග මත බැංකුව විසින් ගෙවන ලද රක්ෂණ වාරිකය රු.10000කි.
4. බැංකු ගිණුමකට කෙලින්ම ලද ලාභාංශය රු. 10,000 කි.

25. පෙරේරාගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු.5000ක් විය. 2018 ඔක්තෝබර් මාසයේ සුළුමුදල් වියදම රු. 4750ක් විය. නොවැම්බර් 01 දින රු. 5250ක් අග්‍රිමය ප්‍රතිපූරණය කරන ලදි. පෙරේරාගේ ව්‍යාපාරයේ සුළු මුදල් සම්බන්ධව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. නොවැම්බර් මාසය සඳහා සුළුමුදල් අග්‍රිමයේ වටිනාකම රු.5500කි.
2. ඔක්තොබර් 31 දිනට සුළුමුදල් භාරකරු අත ඉතිරිමුදල රු.750කි.
3. ඔක්තෝබර් මාසයේ සුළු මුදල් වියදම රු. 5250 කි.
4. නොවැම්බර් මාසයේ සිට සුළු මුදල් වැඩිවීම රු. 250කි.

26. විකුණුම් ජ'නලය,

1. මූලාශ්‍ර ලියවිල්ලකි. 2.ලෙජර් ගිණුමකි.

3.මූලික සටහන් පොතකි. 4. මූල්‍ය ප්‍රකාශනයකි.

27. වැඩිවීම හර, අඩුවීම බැර යන ද්විත්ව සටහන් මූලධර්මය නිරූපණය වන ගිණුම වන්නේ,

1.හිමිකම් හා වගකීම් 2.වත්කම් හා වියදම්

3.වත්කම් හා වගකීම් 4. හිමිකම් හා වත්කම්

28. ව්‍යාපාරයක් තම ණය ගැතියෙකුගෙන් ලද චෙක් පතක් සටහන් කිරිමට අදාල වන මූලික පොත වනුයේ,

1. ණය ගැති ගිණුම 2.ණය හිමිගිණුම

3. බැංකු ගිණුම 4. මුදල් ගිණුම

පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 29 හා 30ට පිළිතුරු සපයන්න.

ණය හිමියෙකුගෙන් ලද රු. 2500ක වට්ටම ව්‍යාපාරය විසින් සටහන් කර තිබූ ආකාරය පහත දැක්වෙන ද්විත්ව සටහන තුළ දෘෂ්‍යමාන වේ.

ණයහිමි ගිණුම හර 5200

ලද වට්ටම් ගිණුම 5200

29. ඉහත සටහන නිසා,

1. ශේෂ පිරික්සුම තුලනය නොවේ.

2.ලද වට්ටම රු. 2700ක් වැඩියෙන් නියමිත ගිණුම්වල සටහන් කර ඇත.

3. අවිනිශ්චිත ගිණුමේ රු. 2700ක හර ශේෂයක් ඇති වේ.

4. ලද වට්ටමේ රු. 2700ක වැඩියෙන් නියමිත ගිණුම්වල වැරදි පැත්තේ සටහන් කර ඇත.

30. ඉහත වරද නිවැරදි කිරීමේ ද්විත්ව සටහන වන්නේ,

1. ලද වට්ටම් ගිණුම හර 2500
ණය හිමි ගිණුම බැර 2500

2. ලද වට්ටම් ගිණුම හර 2700
ණය හිමි ගිණුම බැර 2700

3. ණය හිමි ගිණුම හර 2520
ලද වට්ටම් ගිණුම බැර 2500

4. ණය හිමි ගිණුම හර 2700
ලද වට්ටම් ගිණුම බැර 2700

31. අරලිය ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 250කි. මාසික සාමාජික ගාස්තුව රු.100කි. වර්ෂය තුළදී සාමාජිකයන් 180 දෙනෙකු මුදල් ගෙවා ඇත. ආදායම් හා වියදම් ගිණුමේ (ආදායම් ප්‍රකාශය) ඇතුළත් කළ යුතු සාමාජික මුදල් වටිනාකම වනුයේ,

1.රු.25000කි 2. රු.300,000කි 3. රු18,000කි 4.රු. 216,000කි

32. පහත හිස්තැන සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.

ප්‍රාථමික පිරිවැය + ................................ = මුළු නිෂ්පාදන පිරිවැය

1.වක්‍රද්‍රව්‍ය පිරිවැය

2. වක්‍ර ශ්‍රම පිරිවැය

3. නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

4. සියළු ඍජු පිරිවැය

33. දැව අල්මාරි නිෂ්පාදනය කරන ආයතනයක් සම්බන්ධ පහත තොරතුරු ඔබ වෙත සපයා ඇත.

මුළු නිෂ්පාදන පිරිවැය රු 500,000

නිපදවූ ඒකක ගණන 50

ලාභාන්තිකය 50%

ඒකක පිරිවැය හා ලාභය පිළිවෙලින් සටහන් කර ඇති පිළිතුර වන්නේ,

1.රු.50,000 හා 25,000කි

2. රු.10,000 හා 2500කි

3. රු.10,000 හා 5000කි

4. රු.250,000 හා 10,000කි

34. ව්‍යාපාරය විසින් මිලදී ගත් මෝටර් රථයට අදාල තොරතුරු පහත පරිදි වේ.

ගැනුම් මිල රු. 1 000,000

සුන්බුන් අගය 250,000

ප්‍රයෝජනවත් ජීව කාලය අවුරුදු 10කි

මෙම ව්‍යාපාරයේ සරල මාර්ග ක්‍රමයට මෝටර් රථ ක්ෂය කරනු ලබයි නම් මෝටර් රථයේ ක්ෂය කළ හැකි අගය කොපමණද?

1. රු. 75000 2. රු.250,000 3.රු.100,000 4.රු.750,000

පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක 35 හා 40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සුධාරගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනට ගිණුම් පොත් වලින් උපුටා ගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| තොගය(2017.01.01 දිනට) | 150,000 | |
| විකුණුම් | | 500,000 |
| ගැනුම් | 200,000 | |
| ගෙන ඒමේ කුලි | 5,000 | |
| ගොඩනැගිලි(පිරිවැයට) | 250,000 | |
| මෝටර් රථ | 400,000 | |
| ණය ගැතියෝ | 65,000 | |
| ණය හිමියෝ | | 80,000 |
| බැංකු ශේෂය | 30,000 | |
| සේවක වැටුප් | 20,000 | |
| විදුලි බිල්පත් | 10,000 | |
| දුන් වට්ටම් | 5000 | |
| ප්‍රචාරණ වියදම් | 15,000 | |
| 10%බැංකු ණය | | 600,000 |
| බැංකු ණය පොලී | 30,000 | |
| | 1,180,000 | 1,180,000 |

අතිරේක තොරතුරු

* මෝටර්රථ වාර්ෂිකව 10%බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.
* 2017.12.31 දිනට ඉතිරි බඩු තොගය රු.100,000
* බැංකු ණය පොලිය උපචිතව ඇත

35. මෙම ව්‍යාපාරයේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වන්නේ,

1. රු250, 000 2. රු.255,000 3.රු 355,000 4.රු.300,000

36. මෙම ව්‍යාපාරයේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය වන්නේ,

1.රු. 200,000 2.රු.250,000 3.රු245,000 4.රු.300,000

37. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි බෙදා හැරීමේ වියදමක් හා මූල්‍ය වියදමක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,

1. සේවක වැටුප්, විදුලි බිල්පත් 2. ප්‍රචාරණ වියදම්, ණය පොලී

3.දුන් වට්ටම්, විදුලි බිල්පත් 4. දුන් වට්ටම්, ණය පොලී

38. මෙම ව්‍යාපාරයේ 2017.12.31 දිනට මෝටර් රථ වල ධාරන අගය (ශුද්ධ අගය) කොපමණද?

1. රු.360.000 2.රු.400,000 3.රු.440,000 4.රු.350,000

39.2017.12.31 දිනට ව්‍යාපාරයේ ජංගම වත්කම් වල අගය වනුයේ,

1. රු.165000 2.රු.195000 3.රු.95000 4.135000

40. 2017.12.31 දිනට ව්‍යාපාරයේ මුළු වගකීම් වල අගය කොපමණද?

1. රු . 630,000 2.රු.680,000 3.රු,710,000 4.රු.650,000

**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

**අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍ර**

**BUSINESS & ACCOUNTING STUDIES**

# QUESTION PAPER - II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

# අධ්‍යාපන අමාත්‍යාංශය

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

## අ.පො.ස. (සා/ පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

11 ශ්‍රේණිය කාලය - පැය 2 යි

- පළමු ප්‍රශ්නය ඇතුළු ව I කොටසින් ප්‍රශ්න දෙකක්ද ,II කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (X) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ වසර දෙකක පෙර පාසල් ඩිප්ලෝමාවක් හැදෑරූ කසුනි දැනටමත් පෙරපාසල් ගුරුවරියක වන තම මව සමඟ එක්ව රන්දරු නමින් පෙරපාසලක් 2018.01.01 දින ආරම්භ කරන ලදි. මේ සඳහා තම මිතුරෙකුගේ ලොඩනැගිල්ලක් ලබා ගත් අතර ඒ සඳහා මාසිකව රු.25000ක කුලියක් ගෙවිය යුතුය. කසුනි තම ඉතිරිකිරීමේ ගිණුමේ තිබූ රු. 200,000 ක මුදල හා තම මව ලබා දුන් රු. 300,000 ක මුදග ප්‍රාග්ධනය ලෙස යොදා ගෙන අවශ්‍ය සියළුම උපකරණ හා ඩෙස්පුටු ලබාගෙන ඉතා සාර්ථක පෙරපාසලක් ආරම්භ කරන ලදි.මෙය ස්ථාන ගත කර ඇත්තේ නිවාස 500කින් සමන්විත ආසිරි නිවාස සංකීර්ණයට යාබදවය. මෙදිනම රු.120,000ක ණය මුදලක් ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලදී.මේ සඳහා වාර්ශිකව 10%ක පොලියක් ගෙවිය යුතුය.

රන්දරු පෙරපාසල් පළමු මෙහෙයුම් මාසය තුළදි දරුවන් 100ක් ඇතුළත් කර ගත හැකි වූ අතර පහත වියදම්ද මුදලින් දරන ලදි.

| | |
|---|---|
| අත්පිට මුදලට ලබා ගත් පාසල් උපකරණ | රු.250,000 |
| අත්පිට මුදලට ලබා ගත් කාර්යාල උපකරණ | රු.100,000 |
| පළමු මෙහෙයුම් මාසයේ පාසල් ගාස්තු ආදායම | රු.100,000 |
| ගෙවූ මාසික කුලිය | රු,25,000 |
| ගෙවූ ප්‍රවාහන වියදම් | රු5000 |
| ගෙවිය යුතු විදුලි බිල්පත් | රු.10.000 |
| ගෙවූ පොත් වියදම් | රු.15,000 |

පාසල් උපකරණ හා කාර්යාල උපකරණ 12%කින් ක්ෂය කළ යුතු බවට එකඟ විය.

i) (අ) රන්දරු පෙරපාසල කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත්ද?

(ආ)රන්දරු පෙරපාසලේ ව්‍යාපාර අවස්ථාවන් ලියන්න.

ii) රන්දරු පෙරපාසල් නැමැති නාමය ලියා පදිංචිකළ යුතු බව කසුනි සහ ඇගේ මවගේ විශ්වාසය විය.

(අ) ඉහත ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේ ද?

(ආ) ඔබේ ප්‍රකාශයට හේතු දක්වන්න.

iii) (අ) මෙම ව්‍යාපාර ක්‍රමයේ වාසි හා අවාසි දෙක බැගින් නම් කරන්න.

(ආ) මෙම ව්‍යාපාරයට ලිඛිත ගිනුමක් තිබීම වැදගත් ද?

iv) (අ) මෙම ස්ථානයේ ශක්තියක් නම් කරන්න.

(ආ) මෙම ස්ථානයට තිබෙන තර්ජනයක් නම් කරන්න.

v) 2018.01.01 දිනට රන්දරු පෙරපාසලට අදාල ගිණුම්කරණ සමීකරණය අගයන් සමඟ ලියා දක්වන්න.

vi) රු.100,000ක කාර්යාල උපකරණ අත්පිට මුදලට ගැනීම, ගිණුම්ගත කිරීමට අදාල ද්විත්ව සටහන ලියා දන්වන්න.

vii) රන්දරු පෙරපාසල පවත්වාගත යුතු මූලික සටහන් පොත් දෙකක් ලියන්න.

viii) 2018.01.31 දිනට පාසලේ අත ඉතිරි මුදල ගණනය කරන්න.

ix) 2018.01.31 දිනෙන් අවසන් මාසය සඳහා රන්දරු පෙරපාසලේ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

x) (අ)2018.01.31 දිනට රන්දරු පෙරපාසලේ හිමිකම කොපමණද?

(ආ)2018.01.31 දිනට රන්දරු පෙරපාසලේ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දැක්වෙන ජංගම නොවන වත්කම් අයිතම දෙකක් වටිනාකම් සහිතව දක්වන්න.

I කොටස

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

2. (i) (අ) මිනිස් අවශ්‍යතාවයක් යනු කුමක්ද?

(ආ) මෙම මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලනු ලබන්නේ කවුරුන් විසින්ද?

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයක් විසින් පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා පාරිභෝගිකයන් වෙත ලබා දෙන ක්‍රියාවන් හෝ ක්‍රියාවලියක් භාණ්ඩ ලෙස හැඳින්වේ

(ආ) භාණ්ඩ හා සේවා නිශ්පාදනය කිරීම සඳහා යොදා ගන්නා සියළුම සම්පත් නිෂ්පාදන සාදක ලෙස හැඳින්වේ

(ඉ) බැංකු තැන්පතු සඳහා ලබා දෙන පොලී අනුපාතිකය ආර්ථික පරිසර සාධකයක් වේ

(ඊ) පෞද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ ව්‍යාපාර වර්ග කරනුයේ අරමුණු අනුව වේ.

(iii) රමණී පාසල් ළමුන් සඳහා නිල ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ඒ සඳහා ඇය කුලියට ගත් කාමරයක් යොදා ගත් අතර මහන මැෂිමක් ණයට ලබා ගන්නා ලදී. එක් සේවකයෙකුද බඳවා ගන්නා ලදී.

(අ) මෙම ව්‍යාපාරයේ සෘජු පිරිවැයක් දක්වන්න.

(ආ) මෙම ව්‍යාපාරයේ වක්‍ර පිරිවැයක් දක්වන්න.

(iv) ඔබ ප්‍රදේශයේ කෘෂි කාර්මික නිශ්පාදිත අලෙවිකර ගැනීම සඳහා සමූපකාර සමිතියක් ආරම්භ කිරීමට පිරිසක් කටයුතු කරගෙන යන්නේ යැයි සිතන්න. ඒ සඳහා ඔබගෙන් පහත සඳහන් ගැටළු සඳහා ඔවුන් පිළිතුරු අපේක්ෂා කරයි.

(අ) සමූපකාර සමිතියක ආරම්භ කිරීමට සිටියයුතු අවම සාමාජික සංඛ්‍යාව කොපමණද?

(ආ)සමූපකාර සමිති ලියා පදිංචි කිරීම අදාල වන නීතිය කුමක්ද?

3. (i) (අ) සිල්ලර වෙළෙඳාම හා තොග වෙළෙඳාම අතර ප්‍රධාන වෙනස පැහැදිලි කරන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

(iii) චන්දන විසින් මහනුවර සිට කොළඹ දක්වා බස්රථ ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යයි. ඉහත ප්‍රකාශයේ සඳහන් වන ප්‍රවාහන මූලිකාංග නිදසුන සමඟ දක්වන්න.

(iv) (අ) ව්‍යාපාරිකයකු විසින් නිකුත් කරන චෙක් පතක් සඳහා උපරිම ආරක්ෂාවක් සලසා

ගත හැක්කේ කෙසේද?

4. (i) (අ) ව්‍යාපාරයක සඵලදායකත්වය යනු කුමක්ද?

(ii) (අ) ණයපත් භාවිතා කරමින් බැංකු ගිණුම් හිමියෙකුට තම ගිණුමේ ඇති මුදල් ගණුදෙනු සඳහා භාවිතා කළ හැක.

(ආ) සංස්ථාපිත සමාගමක කොටස් කරුවන්ගේ වගකීම මිලදී ගත් කොටස් වල වටිනාකමට සීමා වේ.

(ඉ) වර්තමානයේ ව්‍යාපාරිකයන්ට ටෙලි බැංකු සේවා පහසුකම් යටතේ විදුලි බිල්පත්, ජල බිල්පත් ගෙවීමට හැකියාව ලැබී ඇත.

(ඊ) ආයෝජනයක අවදානම ඉහළ යන විට අපේක්ෂිත ප්‍රතිලාභ පහළ යයි.

(iii) මුනිදාස අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය සඳහා ඉදිරිපත් වන සිසුන්ට ප්‍රශ්න පත්‍ර පොතක් මුද්‍රණය කර අලෙවි කිරීමට තීරණය කරයි.

(අ) මුනිදාසගේ අලෙවිකරණ පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා යොදා ගත යුතු අලෙවිකරණ විචල්‍යයන් මොනවාද?

(ආ)ඉහත අලෙවිකරණ මිශ්‍රයේ නිෂ්පාදිත විචල්‍යයේදී මුනිදාස විසින් සලකා බැලිය යුතු කරුණු දෙකක් දක්වන්න.

(iv) ජයපාල තමා ඉතිරිකර ගත් මුදලක් පහත සඳහන් ආයෝජන මාර්ග වල ආයෝජනය කිරීමට බලාපොරොත්තු වේ.

1.දේපළ මිලදී ගැනීම

2.සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීම

(අ) ඉහත සඳහන් මාර්ග දෙකෙන් වඩාත් සුදුසු මාර්ගය ලෙස ඔබ යෝජනා කරන්නේ කුමක්ද?

(ආ) ඊට හේතු දෙකක් දක්වන්න

II කොටස ගිණුම්කරණය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

5. (i) (අ) වත්කමක් යනු කුමක්ද?

(ආ) වත්කමක ලක්ෂණ දෙකක් නම් කරන්න.

(ii) අසේලගේ ව්‍යාපාරයේ 2018 අගෝස්තු මාසෙට අදාල ණයට විකිණුම් විසුතර පහත දැක්වේ.

| දිනය | ඉන්වොයිස් අංකය | ගැනුම්කරු | ප්‍රමාණය | අනෙකුත් තොරතුරු |
|---|---|---|---|---|
| 2018.08.12 | 499 | අමල් ද සිල්වා | එකක් රු.50 බැගින් ගිණුම්කරණ පොත් 10 ක් | වෙළෙඳ වට්ටම 5% |
| 2018.08.21 | 500 | අමල් ද සිල්වා | එකක් රු.1000 බැගින් පරිගණක පොත් 20 | වෙළෙඳ වට්ටම 10% |

අවශ්‍ය වන්නේ,

අසේලගේ ව්‍යාපාරයේ 2018 අගෝස්තු මාසයේ විකුණුම් ජාලයයි.

(iii) චන්ද්‍රිකාගේ ව්‍යාපාරයේ 2018.01.01 දිනට පැවැති වත්කම් වගකීම් හා හිමිකම් ශේෂ සහ ජනවාරි මාසයේ පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණය යටතේ සටහන් කර තිබූ ආකාරය පහත දැක්වේ.

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| 2018.01.01 ශේෂය | 300,000 | = | 200,000 | + | 100,000 |
| (1) | +100,000(මුදල් | = | - | + | 100,000(අමිල) |
| (2) | -40,000(තොගය = | | | | |
| | +50,000(මුදල්) | = | +10,000(ලාභය) | | - |
| (3) | -10,000(මුදල්) | = | -10,000(විදුලිබිල්) | | - |
| (4) | -25000(මුදල්) | = | -5000(පොලිය) | + | 20000 (බැංකුණය) |

අවශ්‍ය වන්නේ

(අ) ඉහත එක් එක් ගනුදෙනු අගයන් සහිතව ලිවීම.

(ආ) වත්කම් හා වගකීම් වල අගය වැඩිවීම හෝ අඩුවීම දැක්වීම.

(iv) සමරසිංහගේ ව්‍යාපාරයේ 2018 අගෝස්තු මාසයේ පිළියෙල කළ සුළු මුදල් පොත පහත දැක්වේ.

සුළු මුදල් පොත

| ලැබීම් (රු) | ස.නි | දිනය | විස්තරය | ව.අ | ගෙවීම් (රු) | විශ්ලේෂණ තීරු | | | ලෙජර් ගිණුම | ලෙ.පි |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ගමන් | තැපැල් | ලිපි | | |
| 250 | | 8.01 | ශේෂය | | | | | | | |
| 2250 | | 8.01 | මුදල් | | | | | | | |
| | | 8.05 | ගමන් වියදම් | 51 | 250 | 250 | - | - | | |
| | | 8.10 | මුද්දර හා ලිපි කවර | 52 | 450 | - | 450 | - | | |
| | | 8.15 | ලිපි ගොනු කවර | 53 | 300 | - | - | 300 | | |
| | | 8.20 | අසේල | 54 | 900 | - | - | - | 900 | |
| | | 8.25 | කාබන් කඩදාසි | 55 | 200 | - | - | 200 | | |
| | | 8.30 | කුලී රථ ගාස්තු | 56 | 100 | 100 | - | - | | |
| | | | | | | | - | | | |
| 2500 | | | | | 2200 | 350 | 450 | 500 | 900 | |
| 300 | | 8.31 | ශේෂය ප/ගෙ | | 300 | | | | | |
| | | 9.01 | ශේෂය ඉ/ගෙ | | 2500 | | | | | |

06. (i)(අ) බැංකු ප්‍රකාශය යනු කුමක් ද?

(ආ) බැංකු ගිණුමේ අවසාන ශේෂය සහ බැංකු ප්‍රකාශයේ අවසාන ශේෂය එකිනෙකට වෙනස් වීම සඳහා බලපාන හේතු 03ක් සඳහන් කරන්න.

(ii)පහත වගුව සම්පූර් ණ කරන්න.

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛනය | ද්විත්ව සටහන |
|---|---|---|
| I)ව්‍යාපාරයට සේන ලී බඩු සමාගමෙන් ලී බඩු ගත්තා. | (A) ………………………………… | 1.............................................. <br> 2.............................................. |
| II) විකිණීම සඳහා ගුණසිරි සමාගමෙන් භාණ්ඩ ණයට ගත්තා | (B) ………………………………… | 1.............................................. <br> 2.............................................. |

(iii) පෙරේරාගේ 2017.13.31 දිනට ශේෂ පිරික්සුව සම නොවූයෙන් වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදි.

පසුව අනාවරණය වූ තොරතුරු

01. විදුරට ගෙවූ රු. 3200 මුදල ඔහුගේ ගිණුමේ සටහන්ව ඇත්තේ රු. 2300ක් ලෙසය.

02.වික්‍රමගෙන් ගත් භාණ්ඩ වලට අදාළ රු. 20000 ක ඉන්වොයිසියක් පොත් වලින් මග හැරී ඇත.

අවශ්‍ය වන්නේ

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමේ ජනල් සටහන්

(ආ) ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු අවිනිශ්චිත ගිණුම

(iv) සිනිඳු දෙපා පාවහන් නිෂ්පාදන ව්‍යාපාරයේ 2017.12.31 මාසයේ පාවහන් නිෂ්පාදනයට අදාල පිරිවැය තොරතුරු මෙසේය

| | රු. |
|---|---|
| සම් සඳහා | 120 000 |
| සපත්තු මසන්නාගේ වැටුප | 40 000 |
| සෘජු වේතන | 15 000 |
| ඇණ හා පොලිෂ් සඳහා | 5 000 |
| සුපරීක්ෂක වේතනය | 3 000 |
| කම්හල් කුලිය | 12 000 |
| ඉන්දන හා විදුලිය | 8 000 |
| කම්හල් රක්ෂණය | 14 000 |
| යන්ත්‍ර ක්ෂය | 6 000 |

වර්ෂය තුළසපත්තු යුගල් 250 ක් නිපදවා ඇති අතර එක් සපත්තු ජෝඩුවකින් 20%ක ලාභාන්තිකයක්තබා ගැනීම සිදු කරයි නම්,

(අ) මුළු නිශ්පාදන පිරිවැය

(ආ) සපත්තු ජෝඩුවක විකුණුම් මිල ගණනය කරන්න.

07. (i) (අ) නිෂ්පාදිතයක මිල නියම කිරීමේදි ප්‍රධාන සාධකය වන්නේ පිරිවැය වුවද මීට අමතරව සලකා බැලිය යුතු වෙනත් සාධක 03ක් නම් කරන්න.

(ආ) ලැබීම් හා ගෙවීම් ගිණුමක් හා ආදායම් ප්‍රකාශයක් අතර වෙනස්කම් 02ක් නම් කරන්න.

(ii) බණ්ඩාරගේ ව්‍යාපාරයේ 2017 12 වන මාසයේ ශේෂයන් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| මුදල් ශේෂය | 75 000 |
| බැංකු ශේෂය | 44 000 |
| දුන් වට්ටම් | 1 000 |
| ලද වට්ටම් | 2 000 |
| ගැණුම් | 190 000 |
| විකුණුම් | 195 000 |
| ණයගැති | 34 000 |
| ණය හිමි | 41 000 |

අවශ්‍ය වන්නේ

2017 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම.

(iii) දුෂාන්ගේ ව්‍යාපාරයේ 2017.12.31 පිළියෙළ කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | | |
|---|---|---|
| දළ ලාභය | රු. | රු. 250 000 |
| ගොඩනැගිලි පිරිවැය | 86 000 | |
| වැටුප් | 50 000 | |
| විකුණුම් කොමිස් | 47 000 | |
| ප්‍රචාරණය | 10 000 | |
| ණය පොළි | 15 000 | |
| බැංකු ගාස්තු | 5 000 | |
| ණය ගැති හා ණය හිමි | 70 000 | 28 000 |
| අතැති වූ මුදල් | 40 000 | |
| බැංකු ණය | | 35 000 |
| බෙදා හැරීමේ රථය( පිරිවැය) | 200 000 | |
| බෙදා හැරීමේ රථ ක්ෂය වෙන් කිරීම් | | 40 000 |
| බඩු තොගය(2017.12.31) | 30 000 | |
| ප්‍රාග්ධනය | | 200 000 |
| | 553 000 | 553 000 |

අමතර තොරතුරු

- ගෙවිය යුතු විකුණුම් කොමිස් රු. 3000 කි.
- බෙදා හැරීමේ වැන් රථ වාර්ශිකව 20% බැගින් ක්ෂය කරන්න.
- ණය පොළි 5000ක් ගෙවා නැත.

අවශ්‍ය වන්නේ

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය

2017.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

# MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper

අ.පො.ස. සාමාන්‍ය පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍ර

BUSINESS & ACCOUNTING STUDIES

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

# MARKING SCHEME - II



අනුග්‍රහය :

# ව්‍යාපාර හා ගිණුම්කරණය— I

## පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. 4 | 11.4 | 21.1 | 31.1 |
| 2. 2 | 12;3 | 22.2 | 32.3 |
| 3. 2 | 13.3 | 23.3 | 33.3 |
| 4. 1 | 14.1 | 24.3 | 34.4 |
| 5. 3 | 15.3 | 25.1 | 35.2 |
| 6. 3 | 16.4 | 26.3 | 36.3 |
| 7. 3 | 17.2 | 27.2 | 37.2 |
| 8. 2 | 18.3 | 28.4 | 38.1 |
| 9. 3 | 19.3 | 29.2 | 39.2 |
| 10.1 | 20.1 | 30.2 | 40.3 |

# ව්‍යාපාර හා ගිණුම්කරණය— I I

## පිළිතුරු පත්‍රය

(i) (අ) හවුල් ව්‍යාපාරයකි

(ආ) සුපිරි නිවාස සංකීර්ණයක් අසල ස්ථාන ගත කිරීම.

(ii)(අ) ඔව්

(ආ) නීතිමය අවශ්‍යතාවයක් ලබා ගැනීමට

(iii)(අ) වාසි - වැඩි ප්‍රාග්ධනයක් රැස්කළ හැක

විවිධ දක්ෂතා ඇති අයගෙන් ප්‍රයෝජනය ගත හැක

අවාසි - ලාභය බෙදී යාම

වගකීම අසීමිතය

(ආ) 1840 අංක 07 දරණ වංචා වැලැක්වීමේ ආඥා පනත යටතේ රු.1000කට වැඩි ප්‍රාග්ධනයක් සහිත හවුල් ව්‍යාපාර සඳහා ලිඛිත ගිවිසුමක් තිබිය යුතුය.

(iv) (අ) අයිතිකරුවන් සතු විෂය දැනුම හා පුහුණු පාඨමාලා හදාරා තිබීම.

(ආ) ජාත්‍යන්තර පාසල

(v) වත්කම් = හිමිකම් + වගකීම්

600,000 = 500,000 + 100,000

(VI) කාර්යාල උපකරණ ගිණුම හර රු 100,000

මුදල් ගිණුම බැර රු100,000

(VII) * මුදල් ගිණුම * පොදු ජ'නලය

(viii) මුදල් ගිණුම

| | රු | | රු |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 500,000 | කාර්යාල උපකරණ ගැනුම් | 100,000 |
| බැංකු ණය | 100,000 | ගොඩනැගිලි කුලී | 25,000 |
| පාසල් ගාස්තු ලැබීම් | 100,000 | ප්‍රවාහන වියදම් | 5,000 |
| | | වෙනත් වියදම් | 15,000 |
| | | ශේෂය ප/ගෙ | 555,000 |
| | 700,000 | | 700,000 |
| ශේෂය ඉ/ගෙ | 555,000 | | |

(ix) ලාභ හෝ අලාභ ප්‍රකාශනය

| | | |
|---|---|---|
| පාසල් ගාස්තු ලැබීම් | | 100,000 |
| වියදම් | | |
| ගොඩනැගිලි කුලී | 25000 | |
| ප්‍රවාහන වියදම් | 5000 | |
| විදුලි බිල් | 10000 | |
| වෙනත් වියදම් | 15000 | |
| බැංකු ණය පොලී | 1000 | |
| පාසල් උපකරණ ක්ෂය | 2500 | |
| කාර්යාල උපකරණ ක්ෂය | 1000 | (59500) |
| **ශුද්ධ ලාභය** | | **40500** |

(X) (අ) ආරම්භක ප්‍රාග්ධනය රු.500,000

කාලච්ඡේදයේ ලාභය 40,500

2018.01.31 දිනට හිමිකම 540,500

(ආ)පාසල් උපකරණ (250,000-2500) = රු. 247500

කාර්යාල උපකරණ (100,000-1000) = රු. 99,000

2. (i) (අ) ජීවත්වීම සඳහා මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු දෑ. උදා - ආහාර, නිවාස,අධ්‍යාපනය, සෞඛ්‍යය, ආරක්ෂාව,ප්‍රවාහනය,සන්නිවේදනය

(ආ) ව්‍යාපාර විසිනි

(ii) (අ) අසත්‍යයයි

(ආ) සත්‍යයි

(ඉ) සත්‍යයි

(ඊ) අසත්‍යයි

(iii) (අ) නිල ඇඳුම් රෙදි වල පිරිවැය

(ආ) සේවකයන්ගේ වැටුප

ගොඩනැගිලි කුලිය

විදුලිය

මහන මැෂිම සඳහා ණය පොළිය

(iv) (අ) අවම වශයෙන් සාමාජිකයන් දස දෙනෙකි

(ආ) 1972 අංක 05 දරණ සමුපකාර සමිති පණත යටතේ ලියා පදිංචි කළ යුතු වීම.

3. (i) (අ) අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා විකිණීම සිල්ලර වෙළෙඳාම වන අතර නැවත විකිණීමේ අරමුණින් නිෂ්පාදිත මිලට ගැනීම තොග වෙළෙඳාමයි.

(ආ) ව්‍යාපාරයට අයත් තැන්පතු ගෙවීම් සහ ගිණුම් ශේෂය

(ii) (අ) අසත්‍යයි

(ආ) අසත්‍යයි

(ඉ) සත්‍යයි

(ඊ) සත්‍යයි

(iii) මාර්ගය - මහා මාර්ගය

මාධ්‍යය - බස්රථ

බලය -ඛණිජ තෙල්

පර්යන්තය - බස්නැවතුම් පොළ

(iv) (අ) චෙක් පත රේඛනය කිරීමෙනි.

(ආ) චෙක් පතෙහි සඳහන් මුදල බැංකු ගිණුමක් මගින් ලබාගත යුතු නිසා එම මුදල නියමිත පුද්ගලයාට ලැබෙන බව තහවුරු කිරීම

4. (i) (අ) ව්‍යාපාරයක අරමුණු අපේක්ෂිත අයුරින් ඉටුකර ගැනීමයි.

(ආ) අවම සම්පත් ප්‍රමාණයකින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා.

(ii) (අ) අසත්‍යයි

(ආ) සත්‍යයි

(ඉ) සත්‍යයි

(ඊ) අසත්‍යයි

(iii) (අ) නිෂ්පාදිතය - Product

මිල - Price

ස්ථානය -Place

ප්‍රවර්ධනය -Promotion

(ආ)ගුණත්වය, අංගෝපාංග, මෝස්තරය, ඇසුරුම

(iv) (අ) දේපළ හෝ සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීම.

(ආ) දේපල - ඉඩම්, ස්වර්ණාභරණ, වාහන, නිවාස,

- දේපල පරිහරණය කිරීමට හැකිවීම
- දේපල කුලියට හෝ බද්දට දී ආදායම ඉපයීමට හැකිවීම
- මුදල් අවශ්‍යතාවයකදී දේපල විකුණා මුදල් කල හැකි විම
- ප්‍රාග්ධන ලාභ ලැබිය හැකි වීම
- ණය මුදලක් ලබා ගැනීමේදී ඇප සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැක

සාමාන්‍ය කොටස් -

- මිලදී ගත් කොටස් සඳහාලාභාංශ ලැබීමට හැකි වීම.
- ප්‍රාග්ධන ලාභ ඉපයිය හැකි වීම.
- සාමාන්‍ය කොටස් ඇප සුරකුම් ලෙස ඉදිරිපත් කල හැකි වීම.
- ඡන්දය භාවිතා කල හැකි වීම.
- අධ්‍යක්ෂක මණ්ඩලයට පත් විය හැකි වීම

5. (i) (අ) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස බිහිවී ඇති වර්තමාන හා අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයට ගෙන දෙන සම්පත්ය.

(ආ)

- අතීත ගනුදෙනුවක් ලෙස බිහිවීම.
- වර්තමාන හා අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයට ලැබීම.

(ii) විකුණුම් ජ'නලය

| දිනය | ඉන්වොයිස් අංකය | ගැනුම්කරු | මුළු වටිනාකම | ලෙ.පි |
|---|---|---|---|---|
| 18.08.12 | 499 | අනිල් ද සිල්වා | 4,750 | |
| 18.08.21 | 500 | අමල්ද සිල්වා | 18,000 | |
| | | විකුණුම් ගිණුමට මාරුකළා | 22,750 | |

(iii) (අ) 1. අමිලගෙන් රු.100,000ක ණය මුදලක් ලබා ගැනීම

2. රු.40,000ක් පිරිවැය වූ භාණ්ඩ රු.50,000කට අත්පිට මුදලට විකිණීම.

3. රු.10,000ක විදුලිබිල් ගෙවීම

4. රු. 5000ක පොලියක් සහිතව රු.25000ක බැංකු ණය වාරික ගෙවීම.

(ආ) වත්කම් - {100,000+50,000-(40,000+10,000+25,000)} = රු. 75000කින් වැඩිවේ

හිමිකම් -{10,000 - (10,000 +5000)} රු.5000කින් අඩුවේ.

වගකීම් - {100,000—20,000} = රු.80,000කින් වැඩිවේ.

(iv) (අ) රු.2500කි

(ආ) රු.2200කි

(ඉ)

ගමන් වියදම් ගිණුම

| | | |
|---|---|---|
| සු/මු | 350 | |

ගමන් වියදම් ගිණුම

| | | |
|---|---|---|
| සු/මු | 450 | |

ගමන් වියදම් ගිණුම

| | | |
|---|---|---|
| සු/මු | 500 | |

ගමන් වියදම් ගිණුම

| | | |
|---|---|---|
| සු/මු | 900 | |

06. i) (අ) සෑම ජංගම ගිණුම් හිමියෙකු වෙනුවෙන්ම බැංකුව විසින් ගිණුමක් පවත්වාගෙන යනු ලබයි.ඒ ගිණුම පිළිබඳව විස්තරයක් සෑම මසක් අවසන් වූ පසුව ගිණුම් හිමියාට එවනු ලබයි. එය බැංකු ප්‍රකාශය නම් වේ.

(ආ)

- තැන්පත් කළ නමුත් ගිණුමට බැර නොවූ චෙක්පත්.
- නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්
- බැංකුව අයකළ බැංකු ගාස්තු
- ඍජු ප්‍රේෂණ ලැබීම්

(ii)

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛනය | ද්විත්ව සටහන |
|---|---|---|
| I)ව්‍යාපාරයට සේන ලී බඩු සමාගමෙන් ලී බඩු ගත්තා | (A)පොදු ජනලය | 1ලී බඩු ගිණුම හර<br>2 සේන සමාගම බැර |
| II) විකිණීම සඳහා ගුණසිරි සමාගමෙන් භාණ්ඩ ණයට ගත්තා | (B)විකුණුම් ජනලය | 1ගැනුම් ගිණුම හර<br>2 ගුණසිරිගේ ගිණුම බැර |

(iii) (අ)

පොදු ජනලය

| දිනය | වව් අං | විස්තරය | හර | බැර |
|---|---|---|---|---|
| | | විදුරගේ ගිණුම හර | 900 | |
| | | අවිනිශ්චිත ගිණුම බැර | | 900 |
| | | (විදුරගේ ගිණුමේ 900ක් අඩුව සටහන් වීම නිවැරදි කිරීමයි) | | |
| | | ගැනුම් ගිණුම හර | 20,000 | |
| | | වික්‍රමගේ ගිණුමබැර | | 20,000 |
| | | (ගැනුම් ඉන්වොයිසියක් මගහැරීම නිවැරදි කිරීම) | | |

(ආ)

| දිනය | විස්තරය | | වටිනාකම | දිනය | විස්තරය | | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | ඉ/ගෙ | | 900 | | විදුරගේ ගිණුම | | 900 |
| | | | 900 | | | | 900 |

(iv) (අ)

සිනිදු දෙපා ව්‍යාපාරයේ

2017.12. මාසය සඳහා

පිරිවැය ලේඛනය

| | | |
|---|---|---|
| **ප්‍රාථමික පිරිවැය** | | |
| ඍජු ද්‍රව්‍ය (සම්) | 120 000 | |
| ඍජු ශ්‍රව්‍ය (සපත්තු මසන්නාගේ වැටුප) | 40 000 | |
| ඍජු වෙනත් පිරිවැය | 15 000 | |
| | | 175 000 |
| **නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය** | | |
| වක්‍ර ද්‍රව්‍ය, (ඇණ පොලිෂ්) | 5000 | |
| වක්‍ර ශ්‍රමය (සුපරික්ෂක වේතනය) | 30000 | |
| වක්‍ර වෙනත් - කම්හල් කුලී | 12000 | |
| ඉන්ධන හා විදුලිය | 8000 | |
| කම්හල් රක්ෂණය | 14000 | |
| යන්ත්‍ර ක්ෂය | 6000 | |
| | | 75 000 |
| **මුළු නිෂ්පාදන පිරිවැය** | | 250 000 |

(ආ) ඒකකයක පිරිවැය -= $\frac{\text{මුළු පිරිවැය}}{\text{නිෂ්පාදන ඒකක ගණන}}$

= $\frac{250\ 000}{250}$

= රු 1000

ඒකකයක විකුණුම් මිල = ඒකකයක පිරිවැය + ඒකකයක ලාභාන්තිකය

= $1000 + 1000 \times \frac{20}{100}$

= 1000 + 200

= රු 1200

7(අ) භාණ්ඩ සඳහා පවත්නා ඉල්ලුම

ආයතනයේ මිල කිරීමේ පරමාර්ථ

වෙළෙඳපොළ තුළ පවතින සමාන භාණ්ඩ හා ආදේශක භාණ්ඩ වල මිල ගණන්

නීතිමය සාධක

(ආ)

| ලැබීම් හා ගෙවීම් ගිණුම | ආදායම් ප්‍රකාශය |
|---|---|
| මුදල් පොතට බොහෝ දුරට සමානය<br>සියළු මුදල් ලැබීම් හා ගෙවීම් සටහන් කරයි<br>මුදල් පදනමට පිළියෙල කරයි | ලාභ හෝ අලාභ ප්‍රකාශනයට බොහෝ දුරට සමානය<br>වර්ෂයට පමණක් අදාල ආදායම් හා වියදම් සටහන් කරයි<br>උපචිත පදනමට පිළියෙල කරයි. |

(ii) ශේෂ පිරික්සුම

| විස්තරය | හර | බැර |
|---|---|---|
| මුදල් ශේෂය | 75 000 | |
| බැංකු ශේෂය | 44 000 | |
| දුන් වට්ටම් | 1000 | |
| ගැනුම් | 190 000 | |
| ණය ගැති | 34 000 | |
| ලද වට්ටම් | | 2 000 |
| විකුණුම් | | 195 000 |
| ණයහිමි | | 41 000 |
| ප්‍රාග්ධනය | | 106000 |
| | 238 000 | 238 000 |

(iii) දූෂාන්ගේ ව්‍යාපාරයේ

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය

| | | | |
|---|---|---|---|
| දල ලාභය | | | 250 000 |
| එකතු කලා වෙනත් ආදායම් | | | |
| <u>බෙදාහැරීම් වියදම්</u> | | | |
| විකුණුම් කොමිස් | 50 000 | | |
| බෙදා හැරීම් රථ ක්ෂය | 40 000 | | |
| ප්‍රචාරණය | 10 000 | 100 000 | |
| <u>පරිපාලන වියදම්</u> | | | |
| වැටුප් | 50 000 | 50 000 | |
| <u>මූල්‍ය වියදම්</u> | | | |
| ණය පොලී | 20 000 | | |
| බැංකු ගාස්තු | 5 000 | 25 000 | (175 000) |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරුකලා | | | 75 000 |

දූෂාන්ගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනට

මූල්‍ය තත්ව ප්‍රකාශනය

| <u>ජංගම නොවන වත්කම</u> | පිරිවැය | ස. ක්ෂය | ශු. අගය |
|---|---|---|---|
| ගොඩනැගිලි | 86 000 | - | 86 000 |
| බෙදා හැරීමේ රථ | 200 000 | (80 000) | 120 000 |
| <u>ජංගම වත්කම්</u> | 28600 | (80 000) | 206 000 |
| 12/ 31 තොගය | | 30 000 | |
| ණයගැතියෝ | | 70 000 | |
| අතැති මුදල් | | 40 000 | 140 000 |
| <u>හිමිකම් හා වගකීම්</u> | | | 346 000 |
| ප්‍රාග්ධනය | | 200 000 | |
| එකතු ශු. ලාභය | | 75 000 | 275 000 |
| <u>ජංගම නොවන වගකීම්</u> | | | |
| බැංකු ණය | | | 35000 |
| <u>ජංගම වගකීම්</u> | | 3 000 | |
| ගෙවිය යුතු විකුණුම් කොමිස් | | 5 000 | |
| ගෙවිය යුතු ණය පොලී | | 28 000 | |
| ණය හිමියෝ | | | 36000 |
| | | | 346 000 |